# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව

2011

# இலங்கை பௌத்த, பாளி பல்கலைக்கழகம

# ஆண்டறிக்கை

# BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA

# ANNUAL REPORT

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## දැක්ම

''ලෝකයේ ප්‍රමුඛවූ ද විශිෂ්ටතම වු ද බෞද්ධ විශ්වවිද්‍යාලය බවට පත්වීම.''

## මෙහෙවර ප්‍රකාශය
## (ධම්මචක්කං පවත්තෙතුං)

''බුද්ධ ධර්මය පාලි භාෂාව හා තදනුබද්ධ විෂයඥානයෙන් ශික්ෂිත විවිධ කුශලතාවන්ගෙන් පරිපූර්ණ තථාගත ධර්මයෙන් විශද වන ජීවන දර්ශනය ශ්‍රී ලංකාවෙහි මෙන් ම විදේශයන්හි ද ප්‍රවර්ධනය කොට පෝෂණය කිරීමට සමත් උගත් ධර්මදූතයන් ලොවට දායාද කිරීම''.

# පටුන


**පිටු අංකය**

විශ්වවිද්‍යාලයේ දැක්ම මෙහෙවර ප්‍රකාශය 02
මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය 04-06

01. සාමාන්‍ය
 හැඳින්වීම ........................................ 07
 අරමුණු ........................................ 07-08
 විශ්වවිද්‍යාලයේ නිලධරයෝ........................................ 08
 විශ්වවිද්‍යාලයේ පාලක සභාව ........................................ 08-09
 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව ........................................ 09-10
 පීඨ මණ්ඩල ........................................ 11-12
 විගණන කමිටුව ........................................ 12-13
 මුදල් කමිටුව ........................................ 13
 ටෙන්ඩර් මණ්ඩලය ........................................ 14
 කමිටු ........................................ 14-16

02. පීඨ ........................................ 16-20

03. පර්යේෂණ හා ප්‍රකාශන (අධ්‍යයන කාර්ය මණ්ඩලය).................... 21-32

04. විභාග හා අධ්‍යයන කටයුතු........................................ 32-39

05. ත්‍යාග හා ශිෂ්‍යත්ව ........................................ 39-42

06. පුස්තකාලයීය පහසුකම් ........................................ 42-43

07. පරිපාලන කටයුතු
 පරිපාලන සහ පරිපාලන කාර්යය මණ්ඩලය ........................... 43-46
 සප්ත වාර්ෂික නිවාඩු ........................................ 46
 අධ්‍යයන නිවාඩු (දේශීය සහ විදේශීය) ........................................ 46
 විදේශගතවීම් ........................................ 46-47
 පත් කිරීම (අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය) 47-48
 පීඨ පත්වීම් ........................................ 48
 තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් ...................... 48

08. කාර්ය මණ්ඩල පුහුණු ........................................ 49-50

09. මිලදී ගැනීම් ........................................ 51

10. ඉදිකිරීම් හා පහසුකම් සැපයීම ........................................ 51

11. අභ්‍යාසලාභීන් බඳවා ගැනීම ........................................ 51

12. මහපොළ ශිෂ්‍යත්ව ........................................ 52

13. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් හා පීඨ ශිෂ්‍ය සංගම් පිහිටුවීම......... 52

14. උපකරණ උපයෝජනය ........................................ 53

15. මූල්‍ය කටයුතු ........................................ 53-79

16. උපලේඛන ........................................ 80-94

# ගෞරවාර්හ මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය

1995 අංක 37 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතෙන් සංශෝධිතව, 1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත අනුව, 1982 අප්‍රේල් 22 දින ප්‍රතිෂ්ඨාපිත මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන්ගේ අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිටිපන උතුර, ගබඩාවත්ත ස්ථානයෙහි ද, පරිපාලන ගොඩනැගිල්ල හෝමාගම, පිටිපන, මොරගහහේන පාර අංක 37 දරණ ස්ථානයෙහි ද, පශ්චාත් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 214 දරණ ස්ථානයෙහි ක්‍රියාත්මක වේ.

1997 ජුනි මස 09 වෙනි දින සිසුන් සියයකට පමණ ප්‍රමාණවත් නේවාසිකාගාර ද, කුඩා දේශන කාමර හතක් ද, කුඩා පුස්තකාල කාමරයක් සහ කුඩා පරිපාලන ගොඩනැගිල්ලක් සහිත අවම පහසුකම් ඇතිව ආරම්භ කළ අධ්‍යයන ක්‍රියාවලිය අඩුපාඩු සහිතව වුවද ඉතා දියුණු තත්ත්වයකට පත්කර ඇත. අක්කර පහක පමණ ඉඩම් ප්‍රමාණයක් බස්නාහිර පළාත් සභාවෙන් ලබාගෙන, එහි දෙමහල් දේශන ශාලා පහක් ද, තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාර තුනක් ද, භෝජනාගාරයක් ද ඉදිකොට 2005.02.20 දින විවෘත කරන ලදී. අලුතෙන් ලැබුණු ඉඩමෙහි දෙමහල් පීඨ පරිපාලන ගොඩනැගිල්ල, තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල, ශ්‍රවණාගාරය සහ පොදු පහසුකම් ගොඩනැගිල්ල ද ඉදි කරවා ප්‍රයෝජනයට ගනු ලැබේ.

හයිලෙවල් පාරට නුදුරින් පිටිපන හන්දියට ආසන්න මොරගහහේන පාරේ භූමි භාගයක විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල ද ඉදිකරවා උක්ත ගොඩනැගිලි සංකීර්ණය සමග 2010 අගෝස්තු මස 12 දින මහා මහෝපාධ්‍යාය දෛවී භාෂා විශාරද, ෂට්භාෂා පරමේශ්වර, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක, ග්‍රන්ථ විශාරද, රාජකීය පණ්ඩිත ගෞරවාර්හ දවුල්දෙන ඥාණිස්සර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සහ උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා, අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ඇතුළු සම්භාවනීය ගිහි පැවිදි ප්‍රභූන්ගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

මෙලෙස විශ්වවිද්‍යාලයට අත්‍යවශ්‍යව තිබූ යටිතල පහසුකම් රැසක් දියුණු කිරීම සඳහා කටයුතු කිරීම විශ්වවිද්‍යාලයේ අනාගත සංවර්ධනයට ඉමහත් පිටුවහලක් විය. මේ නිසා වාර්ෂිකව ගිහි පැවිදි සිසුන් 110 දෙනෙකු බඳවා ගැනීමට හැකි වී ඇති බව ද සතුටින් සඳහන් කරමි.

විශ්වවිද්‍යාලයට ඇතුළත් වන ගිහි පැවිදි සියලු ම ශිෂ්‍යයන්ගේ මානසික ශික්ෂණය ඇති කිරීම සඳහා බෞද්ධ උපදේශන පාඨමාලාවක් ඇති කොට, එමඟින් ප්‍රායෝගික භාවනා වැඩසටහනක් හඳුන්වා දී ඇත. එය සිසුන් සියලු දෙනාගේ ම ප්‍රසාදය දිනා ගත් ජනප්‍රිය පාඨමාලාවකි. එහි වටිනාකම හා ප්‍රයෝජනය සළකා විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා 2011 වර්ෂයේ සිසු කණ්ඩායමේ සිට සියළු ම ප්‍රථම වර්ෂ සිසු කණ්ඩායමට අනිවාර්යය කිරීමට පීඨ මණ්ඩලයත්, සනාතන සභාවත්, පාලක සභාවත් ඒකමතිකව සම්මත කොට තිබීම ඉතා ම වැදගත් කරුණකි. එසේම බෞද්ධ උපදේශනය දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් 2011 වසරේ සිට අලුතෙන් හඳුන්වා දී ඇත.

විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හිටපු ජනාධිපතිතුමියගේ විශේෂ ඉල්ලීම පරිදි දෑඅවුරුදු විදේශ ධර්මදූත සේවා පාඨමාලාවක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කොට දනට පවත්වාගෙන යනු ලැබේ. ශිෂ්‍යයින්ගේ ඉංග්‍රීසි භාෂා දනුම දියුණු කිරීම සඳහා ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාවක් ද, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව ද ආරම්භ කළෙමි. ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හැදෑරීමට කැමති සිසුන්ට අවස්ථාවක් ලබාදීම වශයෙන් ඉංග්‍රීසි අධ්‍යයන අංශයක් ද ආරම්භ කර ඇත.

තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ඉගැන්වීම් කටයුතු දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සහයෝගයෙන් සැලසුම් කරගෙන යන අතර විශ්වවිද්‍යාලයේ සෑම අංශයක්ම පරිගණකගත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර දැනට එම කටයුතු නිමවෙමින් පවතී.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ද කටයුතු කර ඇති අතර මහෝපාධ්‍යාය අරමුදල යටතේ ශිෂ්‍ය හා සේවක දෙපක්ෂයේ ම සුභසාධන කටයුතු සඳහා පහසුකම් සලසා ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා එක් එක් ආචාර්යවරුන් විසින් මාසිකව ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකාවක් බැගින් ඉදිරිපත් කිරීමට ද, ඒවා "බෞද්ධ හා පාලි අධ්‍යයන" වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීමට ද කටයුතු යොදා ඇත. 2012 වර්ෂය අවසාන වන විට මෙවැනි වැඩමුළු 71 ක් පවත්වා ඇති බව සඳහන් කරනුයේ බලවත් සතුටිණි.

2005 වර්ෂයේ සිට අභ්‍යන්තර සිසුන් සඳහා පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා හඳුන්වා දී ඇත. එයට අමතරව නූතන භාෂා වශයෙන් ජර්මන්, ජපන්, චීන, හින්දි. කොරියන් සහ දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලා ද ආරම්භ කර ඇත. සියළු පාඨමාලා සිසුන්ට වඩාත් ප්‍රයෝජනවත් වන පරිදි සකසා දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලා බවට 2011 වර්ෂයේ සිට පරිවර්තනය කර ඇත. ඈත ගම්දනව්වලින් පැමිණ සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තම අධ්‍යයන කාර්යයෙන් පසු නැවතත් බොහෝ දෙනෙකු යනුයේ තම දායකයින් වෙත ය. ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවල එක පැත්තකි හැම කාර්යකටම සුභ මුහුර්ථයක් බලා ගැනීම. එහි දී ඔවුනට උපකාරවීම පිණිස අවශ්‍යවන ජ්‍යෝතිෂය පිළිබඳ දැනුම ලබාදීම සඳහා 2011 වර්ෂයේ සිට අළුතෙන් ජ්‍යොතීර් විද්‍යා සහ වාස්තු විද්‍යා දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කළෙමි. 2012 වර්ෂයේ සිට 2017 දක්වා පස් අවුරුදු සැලැස්මක් ද සකස් කර වාර්ෂිකව යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

2550 බුද්ධ ජයන්තිය නිමිත්තෙන් විද්‍යුත් මාධ්‍ය ධර්මදේශකයන් වහන්සේලා පුහුණු කිරීම සඳහා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ධර්ම සන්නිවේදන පාඨමාලාවක් ආරම්භ කර ඇත. ආගමික හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ සහය ඇතිව නව පාඨමාලා හඳුන්වාදීමට ද කටයුතු කර ඇත.

දැනට විදේශීය සිසුන් 131ක් පමණ අභ්‍යන්තර සිසුන් වශයෙන් ලියාපදිංචි වී ඉගෙනුම ලබන බැවින් ද, සිංගප්පූරුව, මැලේසියාව, ඇමරිකාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ඔස්ට්‍රියාව, ස්කොට්ලන්තය, දකුණු කොරියාව, බංගලාදේශය යන විදේශීය රටවල මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතන ක්‍රියාත්මක වන හෙයින් ද මෙය ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් බවට පත් වී ඇති බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සප්තවාර්ෂික නිවාඩු ලබා මෙම විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර ගනු ලැබූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.ඩබ්ලිව්. විමල් විජේරත්න මහතාගේ මෙහෙයවීම යටතේ නටබුන් වූ පෞරාණික බෞද්ධ සිද්ධස්ථාන වෙත ගොස් ඒවා පිළිබඳව ගවේෂණාත්මක පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් සිදු කර ඇත. ''තේලකටාහ ගාථා'' ඉපැරණි පාලි ග්‍රන්ථය සංස්කරණය කොට, මෙම විශ්වවිද්‍යාලයට වසර 25 ක් සපිරෙන 2007 වසරේ එය මුද්‍රණද්වාරයෙන් එළි දක්වා ඇත.

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි හා බාහිර විභාග අංශයේ බාහිර පාඨමාලා එකොළහක් පමණ දැනට ක්‍රියාත්මක වේ. බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව, පාලි ඩිප්ලෝමා පාඨමාලාව, සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලාව, දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව, ධර්ම සන්නිවේදනය ඩිප්ලෝමා පාඨමාලාව, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව, විදේශ ධර්මදූත සේවා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලාව, ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව, ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව, ශාස්ත්‍රපති පර්යේෂණ පාඨමාලාව සහ දර්ශනපති/දර්ශනශූරී උපාධි පාඨමාලාව, බෞද්ධ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ආදී පාඨමාලා ක්‍රියාත්මක වේ. 2012 වසරේ එම සියලු පාඨමාලාවන් දේශීය වශයෙන් සිසුන් 4782 දෙනෙක් ද විදේශීය ආයතන මාර්ගයෙන් සිසුන් 211 දෙනෙක් ද ලියාපදිංචිව පාඨමාලා හැදෑරූහ.

මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා හෝමාගම පරිශ්‍රයේ විදේශීය සිසුන් සඳහා නේවාසිකාගාර, විභාග ශාලා, භාවනා මන්දිර, කථිකාචාර්යවරුන් සඳහා නේවාසිකාගාර ඉදිරි වර්ෂවල දී ඉදිකිරීමට සැළසුම් කර ඇත. ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ජපානය, ඇමරිකාව ආදි රටවල විදේශීය ආයතන පිහිටුවීමට තව දුරටත් සාකච්ඡා කරමින් පවති. ඉන්දියාව, තායිලන්තය වැනි රටවල් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර සිසු හුවමාරු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ද බලාපොරොත්තු වෙමි. දැනට පෝලන්තයේ වර්සෝ (Warsaw) විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කෙටුම්පත් සකස් කරමින් පවතී.

මෙලෙස විවිධ ක්‍රමෝපායයන් මඟින් දේශීය හා විදේශීය වශයෙන් බුද්ධධර්මය පිළිබඳ උගතුන් බිහිකරමින් ලෝක ජනතාවට බුද්ධ ධර්මයෙන් ලැබිය හැකි සහාය ලබාදීමට අප විශ්වවිද්‍යාලය තව තවත් භෞතික සහ මානව සම්පත් වලින් ද දියුණු කළ යුතු ය. ඒ සඳහා අප ඇප කැපව ක්‍රියා කළ යුතුව ඇත.

මහාචාර්ය ආචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර
**මහෝපාධ්‍යාය**

# 01. සාමාන්‍ය

## (අ) හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ 1981 අංක 74 දරන පාර්ලිමේන්තු පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 1982 අප්‍රේල් මස 22 වෙනි දින කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 214 යන ස්ථානයෙහි උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී. බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම, ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම හා අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සඳහා පහසුකම් සැලැස්වීම මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වේ.

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත මගින් යථෝක්ත පනත සංශෝධනය කොට ඇත. එකී සංශෝධන ක්‍රියාත්මක වීමත් සමඟ මෙතෙක් පැවති දේශීය අනුබද්ධායතන අහෝසි වී ඇති අතර, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි ව්‍යුහයට අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කොට, විශ්වවිද්‍යාලයේ බාහිර විභාග හා පශ්චාත් උපාධි අධ්‍යයන මධ්‍යස්ථානය කොළඹ පරිශ්‍රයේ ද, නේවාසිකාගාර සහිතව අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිටිපන ද, පරිපාලන මධ්‍යස්ථානය අංක 37, මොරගහහේන පාර, පිටිපන ද ස්ථානගත කොට ඇත. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සකලාංග සම්පූර්ණ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට අවශ්‍ය මූලික විධිවිධාන දැනටමත් සම්පාදනය කොට තිබේ. පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය ද දරන අතර, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ Committee of Vice Chancellors and Directors (C.V.C.D.) හි ආශ්‍රිත සාමාජිකයෙකි.

## (ආ) අරමුණු

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනතේ විධිවිධාන අනුව ප්‍රතිව්‍යුහගත විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දක්වේ.

I. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම,

II. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාලි භාෂාව, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයට ගැළපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම,

II. (අ) පිරිවෙන්වල, පාසල්වල සහ ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම,

(ආ) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සියලු ම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වාගෙන යාම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම සහ

(ඇ) ඉහත සඳහන් කාරණා කිසිවක් සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණා.

## (ඇ) විශ්වවිද්‍යාලයේ නිලධරයෝ

ශ්‍රී ලංකා අමරපුර මහ සංඝ සභාවේ අති පූජ්‍ය රාජකීය පණ්ඩිත දවුල්දෙන ඥාණිස්සර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යාය ධූරය උසුලති. පූජ්‍ය මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහෝපාධ්‍යාය ධූරය උසුලති. බෞද්ධ අධ්‍යයන පීඨාධිපති වශයෙන් මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ කටයුතු කරන අතර භාෂා අධ්‍යයන පීඨාධිපති වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ කටයුතු කරති. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී ලෙස ආර්.ඒ. පියරත්න මහතා කටයුතු කරයි. සී. කරුණාරත්න මහත්මිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරී ලෙස කටයුතු කරයි. මූල්‍යාධිකාරී ලෙස පී. පී. ප්‍රනාන්දු මිය කටයුතු කරයි.

## (ඈ) විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලය - පාලක සභාව

01. මහෝපාධ්‍යායයන් වහන්සේ - මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

02. **ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරු** :-

**භාෂා අධ්‍යයන පීඨාධිපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති** - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ

03. සනාතන සභා සාමාජිකයින් අතුරින් තෝරා පත් කරගත් සාමාජිකයින් :

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා

04. බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම්
හෝ ඔහුගේ නාමිකයා - එච්.ජී. සී. හේරත් මහතා (ලේකම්)

05. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
හෝ ඔහුගේ නාමිකයා :- පියසේන රණේපුර මහතා
(අතිරේක ලේකම්)

06. විෂය භාර ගරු ඇමතිතුමා විසින්
පත් කළ සාමාජිකයන් : - මහාචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

මහාචාර්ය පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත තිරිකුණාමලේ ආනන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පූජ්‍ය බානගල උපතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා

එස්.සී. මාන්නප්පෙරුම මහතා

නීතිඥ එම්.එස්.බී. රැලපනාව මහතා

07. පාලක සභාවේ ලේකම් ලෙස :- ආර්.ඒ. පියරත්න මහතා, ලේඛකාධිකාරී

පාලක සභා රැස්වීම් පැවැත්වූ වාර ගණන :

2011.01.25 දින සිට 2011.12.20 දින දක්වා පාලක සභා වාර 11 ක් සහ විශේෂ පාලක සභා වාර 02 ක් පවත්වා ඇත.

## සනාතන සභාව

01. **මහෝපාධ්‍යායයන් වහන්සේ** - මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

02. **ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරු :-**

**භාෂා අධ්‍යයන පීඨාධිපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති** - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ

03. **එක් එක් අධ්‍යයනාංශ ප්‍රධානීහු :**

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2011.02.08 දින සිට (පාලි අධ්‍යයනාංශාධිපති)
- මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි ස්වාමීන්ද්‍රයන් වහන්සේ (සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශාධිපති)
- මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේ (සංස්කෘත අධ්‍යයනාංශාධිපති)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බෞද්ධ දර්ශන අධ්‍යයනාංශාධිපති)
- මහාචාර්ය ඊ.ඒ වික්‍රමසිංහ මහතා (සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශාධිපති)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මහත්මිය 2011.02.08 දින දක්වා (පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපතිනි)
- මහාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මහත්මිය 2011.03.08 දින සිට (පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපතිනි)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය (බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශාධිපතිනි

04. පුස්තකාලයාධිකාරී:- - චන්ද්‍රා කරුණාරත්න මහත්මිය 2011.06.13 දින දක්වා
- මනෝරි සමරකෝන් මෙනවිය 2011.06.14 දින සිට

05. මහාචාර්යː- මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි

06. **පීඨ නියෝජිත :-**

**භාෂා අධ්‍යයන පීඨය -** සහාය මහාචාර්ය පූජ්‍ය දූනුකේවත්තේ ගුණරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**බෞද්ධ අධ්‍යයන පීඨය** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය - 2011.03.07 දින දක්වා

07. පත් කරන ලද සාමාජිකයන් **:-**

1. මහාචාර්ය පූජ්‍ය තැරැලේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ
2. ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ
3. ආචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ
4. මහාචාර්ය උදිත ගරුසිංහ මහතා
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතා

08. සනාතන සභාවේ ලේකම් **:-**

ආර්.ඒ. පියරත්න මහතා, ලේඛකාධිකාරී

සනාතන සභා රැස්වීම් පැවැත්වූ වාර ගණන :

2011.01.01 දින සිට 2011.11.08 දින දක්වා සනාතන සභා වාර 11 ක් පවත්වා ඇත.

## පීඨ මණ්ඩල

සංශෝධිත පනතේ විධිවිධාන අනුව එක් එක් පීඨය සඳහා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත පීඨ මණ්ඩල දෙකක් පිහිටුවන ලදී.

## (අ) බෞද්ධ අධ්‍යයන පීඨය

1. පීඨාධිපති - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි
2. මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි
3. මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි
4. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය
6. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මිය
7. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මිය
8. ආධුනික කථිකාචාර්ය සමන්ත ඉලංගකෝන් මහතා
9. ආධුනික කථිකාචාර්ය පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි
10. බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශිකා ඩබ්.පී.එල්.එම්. නිලූෂිකා මිය

## පීඨ මණ්ඩල ශිෂ්‍ය නියෝජිතවරු

01. පූජ්‍ය අස්මඩලේ ධම්මරතන හිමි
02. පූජ්‍ය ගුරුවල සුසීල හිමි

## පත්කළ සාමාජික

01. මහාචාර්ය දයා එදිරිසිංහ මහතා
02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා
03. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතා

පීඨ මණ්ඩල ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) - පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි 2011.07.27 දින දක්වා කටයුතු කළේ ය. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) ඊ.ඒ. ගුණසේන මහතා 2011.08.24 සිට ආවරණ කටයුතු කළේය. 2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

## (ආ) භාෂා අධ්‍යයන පීඨය

01. පීඨාධිපති - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි
02. මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන හිමි
03. පූජ්‍ය මහාචාර්ය නෙළුවේ සුමනවංශ හිමි
04. මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා
05. සහාය මහාචාර්ය පූජ්‍ය දූනුකේවත්තේ ගුණරතන හිමි
06. ආධුනික කථිකාචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
07. කථිකාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි (2011.04.06 දින සිට )
08. එම්.එච්.පී.කේ. ගුණසේන මහතා
09. එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක - 2011.08.18 දක්වා
10. ආධුනික කථිකාචාර්ය වරුණි තෙන්නකෝන් මිය

## පීඨ මණ්ඩල ශිෂ්‍ය නියෝජිතවරු

01. පූජ්‍ය මඩවල අරියරතන හිමි
02. පූජ්‍ය ගල්ලෑල්ලේ ධම්මදින්න හිමි

## බාහිර සාමාජිකවරු

01. මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා
02. ආචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ මහතා
03. පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි

පීඨ මණ්ඩල ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි 2011.07.27 දින දක්වා කටයුතු කළේය. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) ඊ.ඒ. ගුණසේන මහතා 2011.08.24 දින සිට වැඩ ආවරණය කළේය.

2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා බෞද්ධ අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත. භාෂා අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

## විගණන හා කළමනාකරණ කමිටුව

1. එස්.පී.එම්.කේ. සිරිවර්ධන මහත්මිය
   (සභාපතිනි, - 2011.01.18 දින පැවති 75 වන රැස්වීම සඳහා පමණි), පාලක සභා සාමාජික, ප්‍රධාන ගණකාධිකාරී, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. පී. රණේපුර මහතා
   (සභාපති - 2011.02.15 දින සිට පැවති 76,77.78 වන රැස්වීම් සඳහා)
   අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

3. මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා (සාමාජික)
   පාලක සභා සාමාජික
4. එස්.සී. මානප්පෙරුම මහතා (සාමාජික)
   පාලක සභා සාමාජික
5. ආර්.ඒ. පියරත්න මහතා (සාමාජික)
   ලේඛකාධිකාරී
6. ජානක වැලිවත්ත මහතා - (නිරීක්ෂක)
   විගණන අධිකාරී
7. එච්.පී. වීරසිංහ මහත්මිය - කැඳවුම්කරු - 75,76,77 වන රැස්වීම් සඳහා
   (සහකාර අභ්‍යන්තර විගණක)
8. සී.ජී. කොතලාවල මහතා - කැඳවුම්කරු- 78 වන රැස්වීම්
   වැඩ බලන ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

2011 වර්ෂය තුළ පැවැත්වූ රැස්වීම් වාර ගණන 04 කි.

## මුදල් කමිටුව

1. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි - (සභාපති)
   මහෝපාධ්‍යාය
2. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි
   පීඨාධිපති, භාෂා අධ්‍යයන පීඨය (2011.10.17 දින දක්වා) (සාමාජික)
3. පී. රණේපුර මහතා
   අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - (සාමාජික)
4. එන්.එම්.ඩී. නවරත්න මහතා
   නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරය- (සාමාජික)
5. ආර්.ඒ. පියරත්න මහතා
   ලේඛකාධිකාරී - (සාමාජික)
6. පී.පී. ප්‍රනාන්දු මිය
   මූල්‍යාධිකාරී - (ලේකම්)

2011 වර්ෂය සඳහා මුදල් කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 10 කි.

## ආයතනික ප්‍රසම්පාදන කමිටු හා සුළු ප්‍රසම්පාදන කමිටු - 2011

### 1.1 ආයතනික ප්‍රසම්පාදන කමිටුව

| | | |
|---|---|---|
| 1. | මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි<br>මහෝපාධ්‍යාය | සභාපති |
| 2. | ආර්.ඒ. පියරත්න මහතා<br>ලේඛකාධිකාරී | සාමාජික |
| 3. | එස්.පී.එම්.කේ. සිරිවර්ධන මහත්මිය<br>ප්‍රධාන ගණකාධිකාරී-උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | සාමාජික |
| 4. | ර්.ඒ. ගුණසේන මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) | ලේකම් |

2011 වර්ෂය සඳහා ආයතනික ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් පවත්වන ලද වාර ගණන 01 කි.

### 1.2 සුළු ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ
   පීඨාධිපති - (භාෂා අධ්‍යයන පීඨය) - (සාමාජික)
2. ආර්.ඒ. පියරත්න මහතා
   ලේඛකාධිකාරී - (සභාපති)
3. පී.පී. ප්‍රනාන්දු මිය
   මූල්‍යාධිකාරී - (සාමාජික)
4. එච්.ඒ.පී.පී. කරුණාරත්න මිය
   සහකාර මූල්‍යාධිකාරී - (ලේකම්)
5. ර්.ඒ. ගුණසේන මහතා
   ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - (ආරාධිත සාමාජික)
6. ජී.ටී. කරුණාතිලක මිය
   වැඩ ඉංජිනේරු - (ආරාධිත සාමාජික)

2011 වර්ෂය සඳහා සුළු ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් පවත්වන ලද වාර ගණන 11 කි.

## අධ්‍යයන / අනධ්‍යයන කාර්යමණ්ඩල නිවාස කමිටුව

| | | |
|---|---|---|
| 01. | මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි<br>මහෝපාධ්‍යාය | සභාපති |
| 02. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි<br>පීඨාධිපති (භාෂා අධ්‍යයන) | සාමාජික |
| 03. | මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ<br>පීඨාධිපති (බෞද්ධ අධ්‍යයන) | සාමාජික |
| 04. | ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී | සාමාජික |
| 05. | ජී. ජයතිස්ස මහතා - නියෝජ්‍ය ලේඛකාධිකාරී | ලේකම් |

06. ඊ.ඒ. ගුණසේන මහතා සාමාජික
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන)

2011 වර්ෂය තුළ අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩල නිවාස කමිටුව පවත්වා නැත.

## ආචාර්ය මණ්ඩල රැස්වීම්

2011 වර්ෂය තුළ ආචාර්ය මණ්ඩල රැස්වීම් වාර 07 ක් පවත්වා ඇත.

## ශිෂ්‍ය සුභසාධන කමිටු

2011 වර්ෂය තුළ ශිෂ්‍ය සුභසාධන කමිටු රැස්වීම් වාර 02ක් පවත්වා ඇත. ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි 2011.07.27 දින දක්වා කටයුතු කළේය.

## උසස් උපාධි කමිටුව

01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - පීඨාධිපති, භාෂා අධ්‍යයන
02. මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි - පීඨාධිපති, බෞද්ධ අධ්‍යයන
03. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන හිමි - පාලි අධ්‍යයනාංශාධිපති
04. මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි - සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශාධිපති
05. මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි
06. මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස හිමි - සංස්කෘත අධ්‍යයනාංශාධිපති, වැඩ බලන ඉංග්‍රීසි අධ්‍යයනාංශාධිපති
07. මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා - සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශාධිපති
08. සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි
09. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි - බෞද්ධ දර්ශන අධ්‍යයනාංශාධිපති
10. මහාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මහත්මිය - පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපති
11. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ජී.සී. මුණසිංහ මහත්මිය - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශාධිපති
12. මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා - බාහිර සාමාජික
13. මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා - බාහිර සාමාජික
14. මහාචාර්ය රාජ් සෝමදේව මහතා - බාහිර සාමාජික (ලෙස 2011 මාර්තු මස දක්වා කටයුතු කර ඉල්ලා අස්වී ඇත.) ඒ වෙනුවට මහාචාර්ය අනුර මනතුංග මහතාගේ නම නිර්දේශ වී ඇත.
15. ජී. ජයතිස්ස මහතා - නියෝජ්‍ය ලේඛකාධිකාරී (පශ්චාත් උපාධි හා බාහිර විභාග) - කමිටු ලේකම්

2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

## පරිපාලන නිලධාරි රැස්වීම්

මාසයකට වරක් පැවැත්වීමට කටයුතු කරනු ලබන මෙම රැස්වීමේ දී අංශවල පරිපාලන ගැටලු හා යෝජනා පිළිබඳ සාකච්ඡා කරනු ලබන අතර, මෙයට අමතරව අංශ ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් යුතුව කාර්ය මණ්ඩල රැස්වීමක් ද පවත්වනු ලැබේ.

2011 වසර තුළ පැවැත්වූ රැස්වීම් වාර ගණන 07 කි.

# 02. පීඨ

සංශෝධිත පනතේ විධිවිධාන අනුව හා ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව විසින් නිර්දේශ කර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු ද අනුමත විෂය නිර්දේශ මාලා ද අනුව බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා බෞද්ධ අධ්‍යයන පීඨයක් ද, භාෂා අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා භාෂා අධ්‍යයන පීඨයක් ද වශයෙන් පීඨ දෙකක් පිහිටුවා ඇත.

## පීඨාධිපතිවරු

| | | | |
|---|---|---|---|
| අ. | බෞද්ධ අධ්‍යයන පීඨය | - | මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි (2009.06.01 - 2012.05.31 දක්වා) |
| ආ. | භාෂා අධ්‍යයන පීඨය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි (2011.09.26 - 2014.09.25 දක්වා) |

## අ. බෞද්ධ අධ්‍යයන පීඨය

බෞද්ධ අධ්‍යයන පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයනාංශ හතරකින් (04) සමන්විත වේ.

- I බෞද්ධ දර්ශනය
- II බෞද්ධ සංස්කෘතිය
- III සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය
- IV පුරාවිද්‍යාව

විශ්වවිද්‍යාලයේ පනතේ අරමුණු වඩාත් සාර්ථක කර ගැනිම සඳහා නව අධ්‍යයනාංශ හතරක් (04) ක් බෞද්ධ අධ්‍යයන පීඨය යටතේ ස්ථාපනය කිරීමට යෝජනා වී ඇති අතර ඒ සඳහා සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබී තිබේ. 2010 - 2015 සංයුක්ත

සැලැස්මට අනුව මානව ශාස්ත්‍ර පීඨය නමින් නව පීඨයක් ද, ස්ථාපනය කිරීමට යෝජිතය. ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇති නව අධ්‍යයන අංශවල විෂය ක්ෂේත්‍රය පහත දැක්වේ.

I මනෝ විද්‍යාව
II ආචාර විද්‍යාව
III බටහිර දර්ශනය සහ
IV ප්‍රජා නායකත්වය

මින් ප්‍රජා නායකත්වය විෂයයට අදාළ විෂය නිර්දේශ සකස් කොට සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර ගරු අමාත්‍යතුමාගේ සහ කළමනාකරණ කමිටුවෙහි අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. අනෙක් විෂය ධාරාවන්ට අදාළ විෂය නිර්දේශ සකස් කිරීම සඳහා මහාචාර්යවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට ඒවා සකස් කරගෙන යනු ලැබේ.

## අධ්‍යයනාංශ ප්‍රධාන

I. **බෞද්ධ දර්ශනය** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි

II. **බෞද්ධ සංස්කෘතිය** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ජී.සී. මුණසිංහ මිය

III. **සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය** -මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි

IV. **පුරාවිද්‍යාව** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ජී.එස්.එන්. අමරසේකර මිය
2008.06.05 දින සිට 2011.06.04 දින දක්වා
මහාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය 2011.06.05 දින සිට

## සෙසු ආචාර්ය මණ්ඩලය

01. මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි - මහාචාර්ය

02. කේ.ජී.එස්.එන්. අමරසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

03. සමන්ත ඉලංගකෝන් මහතා - ආධුනික කථිකාචාර්ය

04. පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි - ආධුනික කථිකාචාර්ය

05. ඩබ්.පී.එල්.එම්. නිලුෂිකා මිය - බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශිකා

## බාහිර කථිකාචාර්යවරු

| **අධ්‍යයනාංශය (විෂය)** | **කථිකාචාර්යවරු සංඛ්‍යාව** |
|---|---|
| පුරාවිද්‍යාව | 10 |
| බෞද්ධ දර්ශනය | 12 |
| බෞද්ධ සංස්කෘතිය | 05 |
| සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | 05 |

## භාෂා අධ්‍යයන පීඨය

පහත සඳහන් පරිදි අධ්‍යයනාංශ හතරකින් (04) සහ ඒකක දෙකකින් සමන්විත වේ.

- I සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශය
- II සංස්කෘත අධ්‍යයනාංශය
- III පාලි අධ්‍යයනාංශය
- IV ඉංග්‍රීසි අධ්‍යයනාංශය
- V ඉංග්‍රීසි ඉගැන්වීම් ඒකකය
- VI පරිගණක ඒකකය

## අධ්‍යයනාංශ ප්‍රධානවරු

| | | | |
|---|---|---|---|
| 01. | පාලි අධ්‍යයනාංශය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - 2010.06.19 දින සිට 2011.05.02 දින දක්වා<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන හිමි - 2011.05.03 සිට |
| 02. | සංස්කෘත භාෂා අධ්‍යයනාංශය | - | මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි |
| 03. | සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශය | - | මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා |
| 04. | ඉංග්‍රීසි අධ්‍යයනාංශය (ආවරණ) | - | මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි |
| 05. | ඉංග්‍රීසි ඉගැන්වීම් ඒකකය | - | ආධුනික කථිකාචාර්ය එම්.එච්.පී.කේ. ගුණසේන මහතා |

## සෙසු ආචාර්ය මණ්ඩලය

01. සහාය මහාචාර්ය පූජ්‍ය දූනුකේවත්තේ ගුණරතන හිමි
02. කථිකාචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
03. කථිකාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි
04. ආධුනික කථිකාචාර්ය පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි 2011.01.03 දින සිට
05. ආධුනික කථිකාචාර්ය ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා - 2011.10.03 දක්වා
05. ආධුනික කථිකාචාර්ය කේ.ජී. ස්වර්ණානන්ද මහතා
06. එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක 2011.08.18 දක්වා
07. ආධුනික කථිකාචාර්ය ටී.එම්.ඩබ්.පී. තෙන්නකෝන් මිය - 2011.01.03 දින සිට
08. ආධුනික කථිකාචාර්ය එම්. නිපුනිකා සඳමාලි දිලානි මිය - 2011.02.01 දින සිට

## බාහිර කථිකාචාර්යවරු

| අධ්‍යයනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| සංස්කෘත | 06 |
| පාලි | 05 |
| ජර්මන් | 01 |
| ජපන් | 01 |
| දෙමළ | 01 |
| හින්දි | 01 |
| චීන | 01 |
| කොරියානු | 01 |

## ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය

කේ .ජී. ස්වර්ණානන්ද මහතා - ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය

ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා - ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය

එම්.එච්.පී.කේ. ගුණසේන මහතා - ඉංග්‍රීසි උපදේශක II ශ්‍රේණිය

## පරිගණක උපදේශක

එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක II ශ්‍රේණිය

## බාහිර කථිකාචාර්යවරු පත් කිරීම් 2007 - 2011

| විෂය | 2007 | | 2008 | | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන |
| බෞද්ධ දර්ශනය | 10 | 1960 | 08 | 558 | 13 | 697 | 10 | 668 | 12 | 1386 |
| බෞද්ධ සංස්කෘතිය | 03 | 340 | - | - | 04 | 500 | 04 | 480 | 05 | 480 |
| සංස්කෘත | 03 | 480 | 02 | 300 | 03 | 570 | 02 | 480 | 06 | 1020 |
| පාලි | 06 | 1320 | 03 | 600 | 04 | 720 | 04 | 720 | 05 | 780 |
| පුරාවිද්‍යාව | | | 03 | 180 | 01 | 240 | 05 | 120 | 10 | 462 |
| සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | | | 01 | 120 | 01 | 360 | - | - | 05 | 416 |
| ජර්මන් | | | 01 | 120 | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| ජපන් | | | | | | | 01 | 120 | 01 | 120 |
| කොරියන් | | | 01 | 120 | 01 | 120 | 02 | 160 | 01 | 120 |
| දෙමළ | | | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| හින්දි | | | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| චීන | | | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| එකතුව | 22 | 4100 | 19 | 1998 | 31 | 3687 | 32 | 3228 | 49 | 5264 |

# 03. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රකාශන

## මහාචාර්ය පූජ්‍ය වාව්වේ ධම්මරක්ඛිත හිමි

- **ශාස්ත්‍රීය ප්‍රකාශන**

1. බෞද්ධ ඥාන විභාගවාද ප්‍රවේශය
2. බටහිර අනුභූතිවාදය සහ බුදුදහම
3. "මිනිසා පිළිබඳ බෞද්ධ විග්‍රහය"

   "චරණ" ශාස්ත්‍රීය සංග්‍රහය, (4) වන කලාපය

   සංස්කාරක : පූජ්‍ය මැටිබැඳියේ ධම්මසිරි හිමි, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි

- **ශාස්ත්‍රීය ලිපි**

01. ප්‍රාග් බෞද්ධ බුද්ධ සංකල්පය. සියම් මහනිකායේ උඩව පාර්ශ්වයේ 2011 සම්බුද්ධත්ව ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය

02. නිවන් මග 2011. රජයේ මුද්‍රණාලීය බෞද්ධ සංගමයේ ශාස්ත්‍රීය සංග්‍රහය" කථාවත්ථුප්පකරණයේ පරවාද ප්‍රතිබාහනය"

03. චන්ද්‍රප්‍රභා ශාස්ත්‍රීය සංග්‍රහය - චන්ද්‍රා වික්‍රමගමගේ උපහාර කලාපය 2011. භාරතීය භෞතිකවාද දර්ශන ද්වයක් පිළිබඳ විමසීමක්

## මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි

01. Publications:- Universal Applicability of Buddhism for Lasting Peace. Inter Religious Festival – 2011, Sri Lanka Council of Religions for Peace, Batticaloa.

02. සමය සම්ප්‍රදාය විචාරය විෂයෙහි බෞද්ධ පෙළඹුම කුමක් විය යුතු ද? - 2600 ශ්‍රී සම්බුද්ධ ජයන්ති කලාපය, උඩව සියම් මහා නිකාය විසින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත සඟරාවේ පළ කිරිමට නියමිත ලිපිය.

03. Organizing student's audio-visual public presentation on faith is Buddhism, Hinduism, Christianity and Islam, Auditorium, Buddhist and Pali University of Sri Lanka, 24th August 2011.

04. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද දෙදින වැඩමුළුවට සහභාගි වීම. 2011.11.29 සහ 2011.11.30 දිනයන්හි.

05. 2011 මැයි මස 04 සහ 05 යන දෙදින තුළ පවත්වන ලද "Islamic and Buddhist Inter-Faith Dialogue" ට ආරාධිත නිරීක්ෂකයකු ලෙස සහභාගි වීම.

06. "ශ්‍රී ලංකික බුදුසසුනේ පැවැත්මට හානිකර ලෙස බලපා ඇති අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්" යන මාතෘකාව යටතේ විමලා හේරත් මහත්මිය විසින් දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කොට ඇති පර්යේෂණ නිබන්ධයෙහි උපදේශක ලෙස කටයුතු කිරීම.

07. සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය විෂය සඳහා සාමාන්‍ය උපාධි පාඨමාලාව සඳහා ඒකක ක්‍රමයට අනුව විෂයමාලා සකස් කිරීම.

## පූජ්‍ය පිටිගල විජිත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

- **ශාස්ත්‍රීය ප්‍රකාශන**

01. බෞද්ධ මනෝවිද්‍යාවේ ස්වභාවය
බෞද්ධ මනෝවිද්‍යා ලිපි, ශාස්ත්‍රීය සංග්‍රහය, මහමිතව පඤ්ඤාරතන හිමි, සමන්ත ඉලංගකෝන්, මාගදී, 2011

02. මුල් බුදුසමයේ ආනුභූතික ප්‍රවණතා
විද්‍යෝදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වැගම පියරතන හිමි, විද්‍යෝදය පිරිවෙණේ ආදිශිෂ්‍ය සංගමය, 2011

03. ආචාර්ය උපාධිය සඳහා අවශ්‍ය පර්යේෂණයන්හි යෙදීම

## මහාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මහත්මිය

- **පර්යේෂණ හා ප්‍රකාශන**

01. පිළිකෙම පර්වත ලිපිය, (88-96), ආර්ය විභූෂණ මහාචාර්ය අභය ආර්යසිංහ අනුස්මරණ ග්‍රන්ථය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සම්පාදනයකි. ගොඩගේ සමාගම, කොළඹ

02. බෞද්ධ විහාර වාස්තුවිද්‍යාවේ ඉතිහාසය හා ලක්දිව පැරනි විහාර වාස්තුවිද්‍යාව, (36-47) 2011. චන්ද්‍රප්‍රභා, සම්මානිත මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ අභිනන්දන ශාස්ත්‍රීය ග්‍රන්ථය, සුනේත්‍රා මහාදේවී පිරිවෙන් විද්‍යායතනය, පැපිලියාන

03. ලක්දිව පැරණි සැතපෙන බුදුපිළිම පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්, 153 - 173, 2011" Buddhist Studies, Research Papers Presented at the 6th National Conference

on Buddhist Studies. Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura, Nugegoda

04. පුත්තලම - සප්තශෛලගිරි විහාර ගවේෂණ වාර්තාව, 2011, විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ව්‍යාපෘතිය. (අප්‍රකාශිත)

## කේ.ඒ.එස්.එන්. අමරසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

### ➢ පර්යේෂණ හා ප්‍රකාශන

- පොළොන්නරුව රාජසභා ටැම් ලිපිය<br>ශ්‍රී ලංකාවේ පැරණි වෛද්‍ය ක්‍රමය } (පූජ්‍ය තලහගම ඥාණරතනාභිධාන නාහිමිපාණන්ගේ ජන්ම දිනය නිමිති කරගෙන මුද්‍රණය කරන ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ඉදිරිපත් කරන ලද ලිපි)
- පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂතා පෙන්නුම් කරන කලා කෘති කිහිපයක් පිළිබඳ ලුහුඬු අධ්‍යයනයක් (ධම්මරතන නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය)
- අනුරාධපුර බටහිර ආරාම (පර්යේෂණ ග්‍රන්ථයකි. මුද්‍රණයේ පවතියි).
- ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන සංකේත (පර්යේෂණ ග්‍රන්ථයකි. මුද්‍රණයේ පවතියි).

## එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

### ➢ ශාස්ත්‍රීය ලිපි

01. බෞද්ධ සමාජ සංස්ථා අධ්‍යයනය 2011 - පෙරවදන

02. චන්ද්‍රප්‍රභා 2011, "බෞද්ධ කලා ශිල්පයන්හි සංවර්ධනය විෂයයෙහි කනිෂ්ක රජුගේ දායකත්වය"

## සමන්ත ඉලංගකෝන් මහතා - ආධුනික කථිකාචාර්ය

### ➢ ප්‍රකාශිත ග්‍රන්ථ

01. වාද සියය
02. බෞද්ධ මනෝවිද්‍යා ලිපි - සංස්කාරක

- **ශාස්ත්‍රීය ලිපි**

01. පෘථජ්ජන චින්තනය හා භාෂාත්මක ප්‍රකාශන, ධම්මවිචය, අභයභූමි තපෝවනය, කෑගල්ල
02. PTSD සඳහා බෞද්ධ උපදේශනය, බෞද්ධ මනෝවිද්‍යා ලිපි, මාගධී ආයතනය
03. කාය - චිත්ත ගැටලුව ; බෞද්ධ ප්‍රවේශයක්, බෞද්ධ මනෝවිද්‍යා ලිපි, මාගධී ආයතනය

- **ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම**

01. Alienation and Anatta Concept; A comparative study, රාජ්‍ය ආසියාතික සංගමයෙහි 4 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය

02. චතුෂ්කෝටික තර්කයෙහි ඥාන විභාගාත්මක අගය, රාජ්‍ය ආසියාතික සංගමයෙහි 4 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය

03. මානව ක්ලෝනීකරණය, ආචාර ධර්ම හා බුදු දහම, වෘත්තීය සංවර්ධන වැඩමුළුව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

04. ගුඪ අනුභූතිය; බෞද්ධ හා සුෆී දෘෂ්ටිකෝණ, සුෆී පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, බෝපාල්, ඉන්දියාව

- **අධ්‍යයන කුසලතා**

දර්ශනශූරී උපාධිය සඳහා ලියාපදිංචි වීම, කැලණිය විශ්වවිද්‍යාලය, මාතෘකාව; Alienation, Frustration and Anatta Concept

## <u>ආධුනික කථිකාචාර්ය අලුත්ගම විමලරතන හිමි</u>

- **අධ්‍යයනයන් හා පර්යේෂණ**

1. කාම්බෝජයේ දේවරාජ ලබ්ධිය බුද්ධරාජ ලබ්ධිය බවට පත් වීම පිළිබඳ අධ්‍යයනයක්. (මුද්‍රණයේ)
2. විශ්වවිද්‍යාල ආධුනික කථිකාචාර්යවරුන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ Staff Development Center (SDC) මඟින් පවත්වන ලද CTHE පාඨමාලාව හැදෑරීම හා සහතිකය ලබා ගැනීම.
3. කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මඟින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති දෑඅවුරුදු පාඨමාලාව හදාරමින් සිටී.
4. බුදුදහමේ ව්‍යාප්තිය උදෙසා ථායි රජවරුන්ගේ දායකත්වය, සංස්කාරක : වැලිමඩගම කුසලධම්ම හිමි, තායිලන්තයේ බෞද්ධ සංස්කෘතිය (මුද්‍රණයේ)

## බෞද්ධ අධ්‍යයනය පිළිබඳ උපදේශිකා - ඩබ්.පී.එල්.එම්. නිලූෂිකා මහත්මිය

- **ග්‍රන්ථ**

01. අවප්‍රමාණික මනෝවිද්‍යාව (2009)
02. උපදේශන මනෝවිද්‍යාව (2009)
03. කාර්මික මනෝවිද්‍යාව (2009)

- **ලිපි**

01. චිත්තවේග පිළිබඳ බෞද්ධ විග්‍රහයක්, 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, 2011

02. මූලික බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයක්, වියතුසුයාමය ශාස්ත්‍රීය සංග්‍රහය, 2009

03. පෞරුෂය පිළිබඳ මානවවාදී විශ්ලේෂණය, භාෂාප්‍රභා, සංස්කෘත අධ්‍යයනාංශය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2009

04. “ඉගෙනුම් නොහැකියා “, විදර්ශනා ශාස්ත්‍රීය සංග්‍රහය, 2011

- **Presentation**

01. මානසික රෝග සඳහා සංගීත චිකිත්සාව
(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල වැඩමුළුව - 2009)

02. ශ්‍රී ලංකාවේ ඒඩ්ස් රෝගීන් සඳහා ලැබෙන මනෝ සමාජීය සහයෝගයේ භූමිකාව
(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල වැඩමුළුව - 2010)

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි

- **ප්‍රකාශන**

- අනාපාන සති භාවනා විධි - 2011
  සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

➢ **පර්යේෂණ ලිපි**

- 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය - 2600 සම්බුද්ධත්ව ජයන්ති හා බුදුරජාණනන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය
- නිර්වාණය - බෞද්ධ නාම රූප විභාගය - Menatality and Compreality
- ශ්‍රී කල්‍යාණී දුරුතු ධර්ම දේශනා - 5
- දහම් උයන - ආදායමට වඩා වියදම වැඩි වන්නේ අනුකරණය නිසයි

➢ **දරණ ලද තනතුරු**

1. මහෝපාධ්‍යාය ධූරයේ රාජකාරි කිරීම

   2011.02.24 - 2011.02.25

   2011.04.05 - 2011.04.09

   2011.09.13 - 2011.09.15

   2011.12.25 - 2011.12.30
2. පීඨාධිපති (භාෂා අධ්‍යයන) - 2011
3. චීන භාෂා පාඨමාලා සමායෝජක - 2011
4. දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා සමායෝජක - 2011
5. පාලි ඩිප්ලෝමා සමායෝජක - 2011
6. පර්යේෂණ කමිටු සභාපති - 2011
7. අධ්‍යාපන අමාත්‍යාංශය - බෞද්ධ උපදේශක සාමාජික 2011
8. ගරු සභාපති - කැලණිය චිත්තභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය

## <u>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වැගම පියරතන හිමි</u>

➢ **ශාස්ත්‍රීය ලිපි**

01. පාලි නිකාය සාහිත්‍යයෙහි අලංකාර භාවිතය (රම්බඩගල්ල මොණරාගල විහාරයේ කු/විද්‍යාසාගර මහ පිරිවෙන මගින් එළි දක්වන ලද 'විදු සයුර' ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීම සඳහා ලියන ලද්දකි.
02. යථාභූත ඥානදර්ශනය හා දුක්ඛ සංකල්පය (වෙසක් සිරිසර ධර්ම සංග්‍රහයෙහි පළ කරවීම සඳහා ලියන ලද්දකි)
03. මාතෘභාෂාගත සංයුක්තාක්ෂර පරිණාමයේ දී උප යුක්ත පරිණාම සාධක (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සංස්කෘත භාෂා අධ්‍යයනාංශයේ සුරභාණී සංසදය මගින් එළි දක්වන ලද 'භාෂාප්‍රභා' නැමැති ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීම සඳහා ලියන ලද්දකි).

04. සුත්තනිපාතයේ උරග වර්ගය පිළිබඳ විමර්ශනයක් (2011 විද්‍යොදය ධර්මශාස්ත්‍රීය සංග්‍රහයේ පළ කරන ලදී).

05. පාලි වර්ණමාලාවේ ක්‍රමානුකූලතාව පිළිබඳ විමර්ශනයක් (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් වාර්ෂිකව එළි දක්වන පාලි හා බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරිම සඳහා 2011.07.15 දින ලියන ලද්දකි).

06. පාලියෙහි දක්නට ලැබෙන සමකාලීන ජනපද ව්‍යවහාර (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා වෙනුවෙන් පළ කිරීමට නියමිත අභිස්තුති සංග්‍රහයෙහි පළ කිරීම සඳහා 2011.09.20 දින ලියන ලද්දකි)

➢ **පාඨ ග්‍රන්ථ**

07. සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණ

(මුද්‍රණය සඳහා මහරගම තරංජී මුද්‍රණාලයට 2011.11.20 දින භාර දී ඇත),

➢ **ශාස්ත්‍රීය සඟරා සංස්කරණය**

08. 2011 විද්‍යොදය ධර්මශාස්ත්‍රීය සංග්‍රහය (උපදේශක සංස්කාරක)

09. 2011 විද්‍යොදය (සංස්කාරක)

## <u>මහාචාර්ය පූජ්‍ය නෙළුවේ සුමනවංශ හිමි</u>

01. සංස්කෘත විෂය ක්ෂේත්‍රයෙහි ලා විද්‍යොදය පිරිවෙණෙන් ලද දායකත්වය

පිටු 76 - 92, විද්‍යොදය ධර්මශාස්ත්‍රීය සංග්‍රහය (හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි සියවස් ගුණ සමරු විශේෂ කලාපය, (1872 - 2011). සංස්. පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, පූජ්‍ය පුස්සැල්ලෑවේ ඤාණරතන හිමි - විද්‍යොදය පාරිවෙණික ආදිශිෂ්‍ය සංගමය, කොළඹ 10

02. නූතන මිනිස් ගැටලු සඳහා බුදුදහමෙන් ලැබෙන විසඳුම්
පිටු 75 - 82, චන්ද්‍ර ප්‍රභා (සම්මානිත මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගේ අභිනන්දන ශාස්ත්‍රීය ග්‍රන්ථය - 2011)

03. සූදුකරුගේ විලාපය
භාෂාප්‍රභා පිටු 64-69, පඤ්චම කලාපය - 2011. වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය. සංස්, වැකඳවල විපුලසිරි හිමි, මාවරලේ සන්තින්‍රිය හිමි. සුරභාණි සංසදය, සංස්කෘත අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

04. බුද්ධ වචනයේ ප්‍රාමාණිකත්වය හා පරමාදර්ශි තත්ත්වයේ ස්වභාවය
පිටු 94 - 120, පාරමී - අතිපූජ්‍ය කිහිඹියේ විජිත නාහිමි අභිස්තව ශාස්ත්‍රීය සංග්‍රහය -2011

05. තාදිසා සමණා මම - පූජ්‍ය මලේගොඩ නන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, 2011 (මුද්‍රණයේ)

06. බෙන්තර පාර්ශවීය විහාර නාමාවලිය - 2011
සැකසුම - දෙදියවල තිලකසිරි ස්ථවිර, නෙලුවේ සුමනවංස ස්ථවිර

## මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ

- **පර්යේෂණ**

01. "ගුණ දෝෂ රීති කාව්‍ය සංකල්ප පිලිබඳ විමර්ශනයක්" – චරණ සඟරාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

02. බුදු සමය හා සිංහල ගද්‍ය සාහිත්‍යය, 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය, අධ්‍යාපන අමාත්‍යාංශය, 2011 මැයි 17

- **ප්‍රකාශන**

01. සිංහල භාෂාවේ ද්විරූපතාව හා සංස්කෘතික පසුබිම - මුද්‍රණයේ
02. නූතන සිංහල පද්‍ය කාව්‍ය විචාරය - මුද්‍රණයේ

## සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි

- **පර්යේෂණ**

01. ජාතකපාළිය, ජාතකට්ඨකථා සහ පන්සිය පණස් ජාතක පොත

02. සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ විමර්ශන - 3 බුද්ධපුත්‍රයකු විසින් දක්නා ලද බුදුහාමුදුරුවෝ

03. මෙයට අමතර ව "පන්සිය පණස් ජාතක පොත හා පරිවාර ග්‍රන්ථ ආශ්‍රයෙන් බෝධිසත්ත්ව සංකල්පය" මාතෘකාව යටතේ ආචාර්ය උපාධිය සඳහා පර්යේෂණයක නියැලී සිටිමි

## පූජ්‍ය ආචාර්ය මොරගොල්ලාගම උපරතන හිමි - කථිකාචාර්ය

**01.** Pariyesana Samracanavali research papers, International Pali Conference, 2011, Department of Pali and Buddhist Studies, University of Sri Jayawardhanapura, - "Identity of Pali Language through manarulu Sandesa" (Abstract and Full paper)

**02.** Nibbana (නිර්වාණය) Essays in honour of Venerable Kotiyagala Chandawimala, Editor Dr. Kotiyagala Uparatana, 2011 ”තෙළෙස් ධූතාඞ්ග නිර්වාණගාමී ප්‍රතිපදාවක් ලෙස”

**03.** “Gnanaprabha” Felicitation volume of Ven. Dr. Pathegama Gnanarama Thera, Editorial Board. Assistant Professor Ven. Dr. Ranagamama Chanadavimala, Prof. Asanga Tilakarathna, Prof. Chandima Vijebandara, Singapore, 2011. “An Introduction to Manarulusandesaya”

04. 7th Annual Conference on Buddhist Studies organized by the Department of Pali and Buddhist Studies, University of Sri Jayawardhanapura and the Buddhist Times Trust 17th, 18th December 2011, “A Comparative Study of the Pali Milindapanha and its Chinese Version”

05. Doctor of Philosophy, Wuhan University, P.R. China 2011, Thesis, Title”- “A Critical Study of Pali Milindapanha”

## පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි - ආධුනික කථිකාචාර්ය

01. **හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාඛ්‍යාතයතිපුඞ්ගවස්‍ය සත්ගුණෝත්කර්ෂඃ**

(සංස්කෘතයෙන්), විද්‍යොදය ධර්මශාස්ත්‍රීය සංග්‍රහය- 2011, හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නාහිමි සියවස් ගුණසමරු විශේෂ කලාපය (1911-2011), සංස්කා. පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, පූජ්‍ය පුස්සැල්ලාවේ ඤාණරතන හිමි, විද්‍යෝදය ස්වර්ණ ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය 1872-2011, විද්‍යෝදය පාරිවේණික ආදිශිෂ්‍ය සංගමය, කොළඹ 10, 2011 (පි. 26-27)

02. **සංස්කෘතය මළ භාෂාවකැ යි හැඳින්වීමේ අනුචිත්තාව**

භාෂාප්‍රභා, V කලාපය - 2011, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කා. පූජ්‍ය වැකඳවල විපුලසිරි හිමි, පූජ්‍ය සන්ත්‍රින්ද්‍රිය හිමි, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2011 (පි. 127-137)

03. **ෂඩ්දර්ශනෙෂු සාංඛ්‍යදර්ශනස්‍ය පූර්විකා**

(සංස්කෘතයෙන්), භාෂාප්‍රභා, V කලාපය - 2011. වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කා. පූජ්‍ය වැකඳවල විපුලසිරි හිමි, පූජ්‍ය සන්ත්‍රින්ද්‍රිය හිමි, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2011 (පි. 299-303)

04. **මහායාන නවධර්ම පිළිබඳ හැඳින්වීමක්**

චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, සිවුවැනි කලාපය, සංස්කා. පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි,
පූජ්‍ය පාතේගම සේඛර හිමි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භික්ෂු සංගමය, ගංගොඩවිල, 2011 (මුද්‍රණයේ පවතී)

05. **<u>සංස්කෘත බ්‍රාහ්මණ සාහිත්‍ය පිළිබඳ හැඳින්වීමක්</u>**

විද්‍යාලංකාර ශාස්ත්‍රීය සංග්‍රහය, වෛදික අංකය, 136 වැනි විද්‍යාලංකාර දිනය, සංස්කා.පූජ්‍ය බලදොර ඉන්දජෝති හිමි, පූජ්‍ය බෝධාවල පියභාරතී හිමි, පූජ්‍ය වැලමිටියාවේ ඤාණරතන හිමි, විද්‍යාලංකාර පිරිවෙන් ප්‍රකාශනය, පැලියගොඩ, 2011. (පි.193-206)

06. **<u>ශාසනික සැපත රැඳි ජීවිතය</u>**

සාරද ශාස්ත්‍රීය සංග්‍රහය, සමස්ත ලංකා සසුන්මග භික්ෂු සංවිධානයේ දශ සංවත්සර අනුස්මරණ කලාපය, සංස්කා. පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි, සසුන්මග ප්‍රකාශන, දඹදෙණිය, 2011. (මුද්‍රණයේ පවතී)

07. **<u>ශාසනික හර</u>**

සාරද ශාස්ත්‍රීය සංග්‍රහය, සමස්ත ලංකා සසුන්මග භික්ෂු සංවිධානයේ දශ සංවත්සර අනුස්මරණ කලාපය, සංස්කා, පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි, සසුන්මග ප්‍රකාශන, දඹදෙණිය, 2011. (මුද්‍රණයේ පවතී)

08. **<u>සංස්කෘත ව්‍යාකරණ</u>**

සම්මන්ත්‍රණ පත්‍රිකාව, සංස්කෘත භාෂාව පත්‍රය, අපොස උපෙළ විභාගය- 2011. අපොස උපෙළ විභාග සම්මන්ත්‍රණ මාලාව, අස්ගිරිය මහපිරිවෙන් පරිවේණාධිපති හා ආචාර්ය මණ්ඩලය, අස්ගිරිය මහපිරිවෙන, මහනුවර.

09. **<u>සඟරා සමායෝජක</u>**

භාෂාප්‍රභා, V කලාපය - 2011, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2011

10. **<u>රජයේ විවිධ විභාග පිළිබඳ ඇගයීම් රාජකාරී</u>**

සහකාර පාලක පරීක්ෂක, මූලික පිරිවෙන් අවසාන විභාගය -2011, ප්‍රධාන පරීක්ෂක, මූලික පිරිවෙන් අවසාන විභාගය -2011, සහකාර පාලක පරීක්ෂක, ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය- 2011. ප්‍රධාන පරීක්ෂක, ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය- 2011, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත.

11. **<u>සම්පත් දායකත්වය</u>**

සිරස ටීවී, දෙලොස්මහේ පහන, නේරංජනා ධර්ම සාකච්ඡා වැඩ සටහන, 2011.07.06.

12. **<u>සඟරා ද්වාරප්‍රවේශෝත්සව සංස්කෘත දේශනය</u>**

භාෂාප්‍රභා, V කලාපය - 2011, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, 2011.09.28 දින පැවති දොරට වැඩීමේ උත්සවය, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2011

13. **<u>අපේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය</u>**

ආරාධිත විශේෂ දේශනය, සඟරජ පිරිවෙන් වාර්ෂික ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය - 2011, 2011.10.21, සඟරජ පිරිවෙණ, මල්වතු මහාවිහාරය, මහනුවර

## පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි - ආධුනික කථිකාචාර්ය

- **ශාස්ත්‍රීය ලිපි**

01. මිනිසා පිළිබඳ බෞද්ධ මතය - බෞද්ධ මනෝවිද්‍යා ලිපි සංග්‍රහය 2011 මැයි - 37 - 43 පිටු

02. භාෂාව හා ප්‍රකාශනය සම්බන්ධ බෞද්ධ මතය -අනුදීපනා ශාස්ත්‍රීය සංග්‍රහය 2011 නොවැම්බර් - 416-424 පිටු

- **ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණවලට සහභාගිවීම හා ඉදිරිපත් කරන ලද ශාස්ත්‍රීය ලිපි**

01. In international Buddhist conference – 2011 January 8 – 10 Thailand "Kim Mahavanso Srilankayam mahetihasa Gantho?" 154-160p

02. The Royal Asiatic Society of of Sri Lanka 4$^{TH}$ Research Conference March 25$^{th}$ – 26$^{th}$ 2011
"ධ්‍යාන සමාපත්ති විෂයෙහි බුදුසමය තබා ඇති ඉදිරි පියවර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්"

03. In International Pali Conference – 2011
Un iversity of Sri Jayawardenapura
"Tathagatassa ayasankhara Vassajjanam" 43 – 44 p.

04. 7$^{th}$ Annual national conference on Buddhist Studies
17$^{th}$ – 18$^{th}$ December 2011
"Was Abhayagiri Monastery a Mahayana School?"

- **බාහිර දේශන**

01. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ දේශකයෙකු වශයෙන් කටයුතු කිරීම.

02. දහම් පාසල් ගුරු භවතුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන්වල දේශකයෙකු වශයෙන් කටයුතු කිරීම - වත්තල ශාසනාරක්ෂක බලමණ්ඩලය.

03. අ.පො.ස. (උ.පෙළ) 2011, පාලි විෂයට අදාළ සම්මන්ත්‍රණ පැවැත්වීම.

04. ප්‍රාචීන ප්‍රාරම්භ අදාළ සම්මන්ත්‍රණවල පාලි විෂයට අදාළ දේශන පැවැත්වීම. 2011 අප්‍රෙල් 06 මරදාන ශ්‍රී ලංකා විද්‍යාල පිරිවෙණ.

## Ms. Waruni Tennakoon – Lecturer (Probationary)

- Teaching English as a Second Language (TESL) through English Literature.
- Barriers to learning English in the Pirivena Education System
- Use of Input and Output Hypotheses in teaching English Language via English Literature: An On-going research with the Bikkhu Graduands in the Buddhist and Pali University of Sri Lanka

## Ms. Nipunika Dilani – Lecturer (Probationary)

1. Motivation of R.C. Gardner's Revised Socio-Educational Model of Second Language Learning in the Context of Monastic Education

# 04. විභාග හා අධ්‍යයන කටයුතු

I. **පළමුවන, දෙවන, තෙවන සහ සිවුවන වසරවල සිසුන්ගේ දේශන ආරම්භ කිරීම**

**පැරණි නිර්දේශය අනුව:**

| | |
|---|---|
| ප්‍රථම වාරය | 2011 01.24 දින සිට 2011.04.01 දින දක්වා |
| දෙවන වාරය | 2011.04.25 දින සිට 2011.07.08 දින දක්වා |
| තුන්වන වාරය | 2011.07.25 දින සිට 2011.12.02 දින දක්වා |

**ඒකක ක්‍රමය අනුව:**

| | |
|---|---|
| ප්‍රථම සමාසිකය | 2011 01.24 දින සිට 2011.07.01 දින දක්වා |
| දෙවන සමාසිකය | 2011.07.25 දින සිට 2011.12.02 දින දක්වා |

2011 අධ්‍යයන වර්ෂයට නවක දේශීය සිසුන් 110 දෙනෙක් ද විදේශීය සිසුන් 48 දෙනෙක් ද, බඳවා ගන්නා ලදහ. දෙවන වසර දේශීය සිසුන් 109 දෙනෙක් ද,

විදේශීය සිසුන් 45 දෙනෙක් ද, තෙවන අධ්‍යයන වසර සඳහා දේශීය සිසුන් 100 දෙනෙක් ද විදේශීය සිසුන් 74 දෙනෙක් ද, සිවුවන වසර සඳහා දේශීය සිසුන් 33 දෙනෙක් ද අධ්‍යයන කටයුතුවල නියැළුණහ.

| ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සාරාංශය - 2011 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පළමු වසර | | දෙවන වසර | | තෙවන වසර | | සිවුවන වසර | |
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| බෞද්ධ අධ්‍යයන පීඨය | 54 | 48 | 44 | 45 | 42 | 74 | 16 | - |
| භාෂා අධ්‍යයන පීඨය | 56 | - | 65 | - | 58 | - | 17 | - |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 110 | 48 | 109 | 45 | 100 | 74 | 33 | - |
| | 158 | | 154 | | 174 | | 33 | |
| | 519 | | | | | | | |

## II. බුද්ධධර්ම/පාලි/සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලා

2011 වර්ෂය සඳහා බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 734(දේශිය 631 ක් හා විදේශීය 103) දෙනෙක් ද, පාලි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 54 දෙනෙක් ද ලියාපදිංචි වූහ. 2011 ඔක්තෝබර් මස පරීක්ෂණය පවත්වා 2011..14 දින ප්‍රතිඵල නිකුත් කර ඇත. විස්තර පහත සඳහන් පරිදි ඇත.

| **පාඨමාලාව** | **ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව** | **විභාගයට පෙනී සිටි සංඛ්‍යාව** | **සමත් ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|---|---|
| බුද්ධධර්ම ඩිප්ලෝමාව (දේශීය) | 631 | 373 | 278 |
| මැලේසියාව | 17 | 05 | 05 |
| සිංගප්පූරුව | 55 | 22 | 21 |
| ඔස්ට්‍රියාව | 30 | 20 | 15 |
| පාලි ඩිප්ලෝමාව | 54 | 16 | 08 |
| සංස්කෘත ඩිප්ලෝමාව | 09 | - | - |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 796 | 436 | 327 |

2012 වර්ෂයේ සිට බුද්ධ ධර්ම, පාලි, සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වීමට සැලසුම් කරන ලදී.


## III විදේශ ධර්මදූත සේවා උපාධි පාඨමාලාව (දැඅවුරුදු පාඨමාලාව)

2011 වර්ෂයේ මෙම පාඨමාලාව නොපවත්වන ලදී.

## IV ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2010/2011

2011 සැප්තැම්බර් මස පරීක්ෂණය පවත්වා පහත සඳහන් පරිදි 2011.11.18 වන දින ප්‍රතිඵල නිකුත් කර ඇත.

| **පාඨමාලාව** | **ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව** | **විභාගයට පෙනී සිටි සංඛ්‍යාව** | **සමත් ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|---|---|
| මූලික පාඨමාලාව | 65 | 34 | 28 |
| සහතික පත්‍ර පාඨමාලාව | 46 | 35 | 29 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 255 | 164 | 121 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 366 | 233 | 178 |




### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012

2011/2012 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පහත සඳහන් පරිදි සිසුන් ලියාපදිංචි කර ගන්නා ලදී. 2011.11.26 දින දේශන ආරම්භ කරන ලදී.

| **පාඨමාලාව** | **ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| මූලික පාඨමාලාව | 63 |
| සහතික පත්‍ර පාඨමාලාව | 118 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 299 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 480 |


## V. දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව 2010/2011

2010 වසරේ දී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත මෙම විශ්වවිද්‍යාලය මගින් ලංකාවේ දහම් පාසැල් ගුරුවරුන් සඳහා දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා සිසුන් 2525 ලියාපදිංචි කර ගන්නා ලදී. 2011 ජුනි මස 17, 18 සහ 19 දිනවල පරීක්ෂණය පවත්වා 2011.08.02 දින ප්‍රතිඵල නිකුත් කරන ලදී. සිසුන් 1039 ක් සමත් වී තිබුණි. එම සිසුන් සඳහා 2011.10.27 දින මහරගම, තරුණසේවා සභා ශ්‍රවණාගාරයේ දී සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය

පවත්වා සහතිකපත්‍ර ප්‍රදානය කරන ලදී. පහත සඳහන් පරිදි සිසුන් දිස්ත්‍රික් මට්ටම් යටතේ කුසලතාවයන් දක්වා තිබුණි.

## එක් එක් දිස්ත්‍රික්කයන්හි සමත් වූ සිසුන් ගණන ප්‍රතිශත මට්ටමින්

| අනු අංකය | දිස්ත්‍රික්කය | විභාගයට පෙනි සිටි සිසුන් ගණන | සමත් වූ සිසුන් ගණන | අසමත් වූ සිසුන් ගණන | සමත් වූ සිසුන් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | 97 | 86 | 11 | 88.65% |
| 02 | ගම්පහ | 108 | 93 | 15 | 86.11% |
| 03 | කළුතර | 59 | 56 | 3 | 94.91% |
| 04 | ගාල්ල | 110 | 95 | 15 | 86.36% |
| 05 | මාතර | 109 | 103 | 6 | 94.49% |
| 06 | හම්බන්තොට | 21 | 16 | 5 | 76.19% |
| 07 | රත්නපුර | 76 | 66 | 10 | 86.84% |
| 08 | කෑගල්ල | 53 | 43 | 10 | 81.13% |
| 09 | මහනුවර | 65 | 61 | 4 | 93.84% |
| 10 | මාතලේ | 67 | 55 | 12 | 82.08% |
| 11 | නුවරඑළිය | 21 | 21 | - | 100% |
| 12 | අනුරාධපුරය | 58 | 53 | 5 | 91.37% |
| 13 | පොළොන්නරුව | 54 | 47 | 7 | 87.03% |
| 14 | කුරුණෑගල | 99 | 87 | 12 | 87.87% |
| 15 | පුත්තලම | 47 | 39 | 8 | 82.97% |
| 16 | බදුල්ල | 61 | 54 | 7 | 88.52% |
| 17 | මොණරාගල | 29 | 27 | 2 | 93.10% |
| 18 | අම්පාර | 15 | 15 | - | 100% |
| 19 | ත්‍රිකුණාමලය | 24 | 22 | 2 | 91.66% |
| | එකතුව | 1173 | 1039 | 134 | 100% |



| | සමත් | අසමත් |
|---|---|---|
| ස්වාමීන් වහන්සේලා | 30 | 03 |
| සිල්මාතාවන් | 06 | - |
| පිරිමි | 108 | 25 |
| ගැහැණු | 895 | 106 |
| | 1039 | 134 |

අයදුම්පත් ඉදිරිපත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව - 2525
විභාගය සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව - 1597

විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව - 1173
විභාගය සඳහා නොපැමිණී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව - 424

විභාගයෙන් සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව - 1039
විභාගයෙන් අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව - 134

## VI බෞද්ධ උපදේශන පාඨමාලාව

බෞද්ධ උපදේශනය පදනම් පාඨමාලාව, සහතිකපත්‍ර පාඨමාලාව සහ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම සඳහා අයදුම්පත්‍ර කැඳවන ලදී. 2012 පෙබරවාරි මස පාඨමාලා ආරම්භ කිරීමට නියමිතව ඇත.

## VII කොරියන්/චීන/දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලා

කොරියන් භාෂාව, චීන භාෂාව සහ දෙමළ භාෂාව සඳහා මූලික, සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. 2012 මාර්තු මස පාඨමාලා ආරම්භ කිරීමට නියමිතව ඇත.

## VIII සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) පරීක්ෂණය

2011 වර්ෂයේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලා සඳහා නවක සිසුන් 1597 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ප්‍රථම භාග පරීක්ෂණය සඳහා සිසුන් 815 ක් ද ද්විතීය භාග පරීක්ෂණය සඳහා සිසුන් 807 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

ප්‍රථම භාග හා ද්විතිය භාග සම්මන්ත්‍රණ 2011 ජුනි මස සිට අගෝස්තු මස දක්වා පවත්වන ලද අතර ද්විතීය භාග සම්මන්ත්‍රණ 2011 අගෝස්තු මස සිට ඔක්තෝබර් මස දක්වා පවත්වන ලදී.

ප්‍රථම භාග හා ද්විතීය භාග පරීක්ෂණ 2011 ඔක්තෝබර්, නොවැම්බර් මාසවල පවත්වන ලදී. විභාග ප්‍රතිඵල 2012 වර්ෂයේ මාර්තු මස නිකුත් කිරීමට නියමිතය.

## IX. සාමාන්‍ය/විශේෂ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (අභ්‍යන්තර)

උක්ත පරීක්ෂණ 2011 වර්ෂයේ ඔක්තෝබර්/දෙසැම්බර් මාස වලදී පවත්වන ලදී.

**පරීක්ෂණයේ නම**

ප්‍රථම වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය
ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය (නැවත පෙනී සිටින සිසුන් සඳහා)
සාමාන්‍ය ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය

සාමාන්‍ය ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය
විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය
විශේෂ ශාස්ත්‍රවේදී තෘතීය භාග පරීක්ෂණය

මෙම වර්ෂයේ ඉහත පරීක්ෂණවලට පෙනී සිටි සිසුන්ගේ උත්තර පත්‍ර පරීක්ෂාවට ලක් වෙමින් පැවතීම නිසා ප්‍රතිඵල ඉදිරියේ දී නිකුත් කරීමට නියමිතය.

විශේෂ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ පහත පරීක්ෂණ 2011 ඔක්තෝබර්/දෙසැම්බර් මාසවලදී පවත්වන ලදී.

**පරීක්ෂණයේ නම**

විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (පාලි)
විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (පුරාවිද්‍යාව)
විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (සංස්කෘත)
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (පාලි)
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (පුරාවිද්‍යාව)
විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (සංස්කෘත)
විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (පාලි)
විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (පුරාවිද්‍යාව)
විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (සංස්කෘත)

ඉහත සඳහන් පරීක්ෂණවල උත්තර පත්‍ර දැනට පරීක්ෂාවට යොමුකර ඇත. ඉදිරියේ දී ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කෙරේ.

2011 ඔක්තෝබර්/දෙසැම්බර් මාසවලදී පවත්වන ලද ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (අභ්‍යන්තර) පරීක්ෂණවලදී පාඨමාලා සඳහා පෙනී සිටි සිසුන් පහත සඳහන් පරිදි වේ.

<table>
<tr><th></th><th>පාඨමාලාව</th><th>2011 වර්ෂයේ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව</th></tr>
<tr><td>01</td><td>පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව</td><td>40</td></tr>
<tr><td>02</td><td>ජපන් සහතික පත්‍ර පාඨමාලාව</td><td>03</td></tr>
<tr><td>03</td><td>හින්දි සහතික පත්‍ර පාඨමාලාව</td><td rowspan="4">ඉදිරියේ දී පැවැත්වීමට නියමිතය</td></tr>
<tr><td>04</td><td>චීන සහතික පත්‍ර පාඨමාලාව</td></tr>
<tr><td>05</td><td>කොරියන් සහතික පත්‍ර පාඨමාලාව</td></tr>
<tr><td>06</td><td>බෞද්ධ උපදේශනය</td></tr>
<tr><td>07</td><td>බෞද්ධ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව</td><td>39</td></tr>
<tr><td>08</td><td>ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව</td><td>ඉදිරියේ දී පැවැත්වීමට නියමිතය</td></tr>
<tr><td>09</td><td>උසස් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව</td><td>මෙහි I සහ II ප්‍රශ්න පත්‍ර පැවැත්වූ අතර III ප්‍රශ්න පත්‍රය ඉදිරියේ දී පැවැත්වීමට නියමිතය</td></tr>
</table>

## X බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව


2011 වර්ෂයේ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සිසුන් 24 දෙනෙකු ලියාපදිංචි වු අතර, දේශන 2011 මාර්තු මස සිට ඔක්තෝබර් මස දක්වා පවත්වන ලදී. අවසාන පරීක්ෂණය 2011 දෙසැම්බර් මස පවත්වන ලද අතර 09 දෙනෙකු සමත් වී ඇත.

## XI ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

2011 වර්ෂයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා සිසුන් 227 දෙනෙකු ලියාපදිංචි කර ගත් අතර, එම දේශන 2011 පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා පවත්වන ලදී. 2011 දෙසැම්බර් මස ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය පවත්වන ලද අතර 136 දෙනෙකු සමත් වී ඇත.

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා පහත දැක්වෙන පරිදි ලියාපදිංචි වී ඇත.

| පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ අධ්‍යයන පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 103 |
| බෞද්ධ අධ්‍යයන පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 66 |
| සිංහල භාෂා අධ්‍යයන පාඨමාලාව | 37 |
| පාලි භාෂා අධ්‍යයන පාඨමාලාව | 17 |
| සංස්කෘත භාෂා අධ්‍යයන පාඨමාලාව | 04 |
| මුළු සිසුන් ගණන | 227 |




## XII පර්යේෂණ උපාධි පාඨමාලා (දර්ශනපති/දර්ශනශූරී)

2011 වර්ෂය සඳහා දර්ශනපති උපාධිය සඳහා සිසුන් 05 දෙනෙකු දර්ශනශූරී (ආචාර්ය) උපාධිය සඳහා සිසුන් 01ක් ලියාපදිංචි වී ඇත.

XII **උපාධි ප්‍රදානෝත්සවය**

වර්ෂ දෙකකට වරක් පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවය 2011 ජූනි 10 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.

# 05. ත්‍යාග හා ශිෂ්‍යත්ව

ශිෂ්‍යත්ව නිර්ණායකයන්ට අනුව පහත සඳහන් ශිෂ්‍යත්ව හිමිකම් ලබන සංඛ්‍යාව ඉදිරිපත් කර ඇත.

| | *ශිෂ්‍යත්ව ත්‍යාගයේ නම* | *සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | මහෝපාධ්‍යාය ත්‍යාගය | 01 |
| 02 | එච්.එම්. තිසේරා අනුස්මරණ ත්‍යාගය | 01 |
| 03 | පී. සුබසිංහ ත්‍යාගය | 01 |
| 04 | කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර නාහිමි ත්‍යාගය | 01 |
| 05 | පිඹුරේ ශ්‍රී වාගිශ්වර මහ නාහිමි ත්‍යාගය | 01 |
| 06 | මියුලින් ලියනගේ අනුස්මරණ ත්‍යාගය | 01 |
| 07 | අතිපූජ්‍ය සිරිමල්වත්තේ ආනන්ද නාහිමි ත්‍යාගය | 02 |
| 08 | කොරියන් ජාතික හේ ජෝන් ස්වාමීන්ද්‍ර ශිෂ්‍යත්වය | 03 |
| 09 | බදුරලියේ ජිනාරාම ත්‍යාගය | 01 |
| 10 | හීනටියන ධම්මාලෝක ත්‍යාගය | 01 |
| 11 | කුඹුකේ දොන් සානිස් අප්පුහාමි සහ වන්නිආරච්චිලාගේ ජොස්තිනා ෆොන්සේකා අනුස්මරණ ත්‍යාගය | 01 |
| 12 | ගාමිණි ජයසූරිය පාලි ශිෂ්‍යත්වය | 03 |
| 13 | එන්. සොමිලාවතී බොල්ගොඩපිටිය අනුස්මරණ ශිෂ්‍යත්ව ත්‍යාගය | 02 |
| 14 | ශ්‍රීමත් සිරිල් ද සොයිසා අනුස්මරණ ශිෂ්‍යත්ව ත්‍යාගය | 03 |
| 15 | ප්‍රැන්සිස් හේවාවිදාන ත්‍යාගය | 01 |
| 16 | ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමි ත්‍යාගය | 01 |
| 17 | Ven. Thich Thien Son අභිනන්දන පාලි ත්‍යාගය | 01 |
| 18 | මහාචාර්ය ඔලිවර් අබේනායක ත්‍යාගය | 01 |
| 19 | වැලිල්ලානේ විමලතිස්ස නාහිමි අනුස්මරණ ත්‍යාගය | 01 |
| 20 | අලුදෙණියේ පඤ්ඤානන්ද මාහිමි අනුස්මරණ පාලි ව්‍යාකරණ ත්‍යාගය | 02 |
| 21 | විතාරන්දෙණියේ චන්දජෝති නාහිමි අනුස්මරණ ත්‍යාගය | 03 |
| 22 | මහාචාර්ය මොරටුවේ සාසනරතන අනුනාහිමි සංස්කෘත ත්‍යාගය | 02 |
| 23 | පූජ්‍ය බානගල උපතිස්ස නා හිමි ත්‍යාගය | 01 |

## ත්‍යාග හා ශිෂ්‍යත්ව

### (පශ්චාත් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට අදාළව)

ශිෂ්‍යත්ව නිර්ණායකයන්ට අනුව පහත සඳහන් ශිෂ්‍යත්ව හිමිකම් ලබන සංඛ්‍යාව ඉදිරිපත් කර ඇත.

| | ශිෂ්‍යත්ව ත්‍යාගයේ නම | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | හාතිය දියස් ධීරසේකර ත්‍යාගය | 01 |
| 02 | එච්.එස්. කුරේ ශාස්ත්‍රපති උපාධි කුශලතා ත්‍යාගය | 01 |
| 03 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන නා හිමි ත්‍යාගය | 01 |

ශිෂ්‍යත්ව ලාභීන් හට උපාධි ප්‍රදානෝත්සවයේ දී ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. 2011 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී පහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

## බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා :

මුහන්දිරම් එම්.ජී. පෙරේරා අනුස්මරණ ශිෂ්‍යත්වය
2007

සුරේෂ් ගෝමින්ද රනිල් එදිරිසිංහ අබේනායක මහතා (2007713)
2008

අන්රාදිගේ අනෝජා දමයන්ති පෙරේරා (2008707)

## ශාස්ත්‍රපති උපාධිː

01. **කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි ත්‍යාගය**

2007
පූජ්‍ය කොස්වැටියේ නන්දසිරි හිමි (20078040)

යමාන්න කංකානමගේ ජගත් නෙල්සන් කුලරත්න (20078081)

2008
පූජ්‍ය විලච්චියේ කාශ්‍යප හිමි (20088053)

02. **හාතිය දියස් ධීරසේකර ත්‍යාගය**

2007
පූජ්‍ය රත්මලානේ ආනන්ද හිමි (20078066)

2008
Ven. Bogahawawe Khemananda (2008080)

03. **එච්.එස්. කුරේ ශාස්ත්‍රපති උපාධි කුශලතා ත්‍යාගය**

පූජ්‍ය අළුයටවල ධම්මික හිමි (20078037)
Ven. Suvannasiri

2008
පූජ්‍ය පිටිගල ධම්මවිනීත හිමි (20088015)

Ven. Sirinda (20088015)
Ven. Ashin Arindama (20088068)
Ven. Bogahawawe Khemananda (20088080)

## බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2010

01. **මොහන්දිරම් එම්.ජී. පෙරේරා අනුස්මරණ ශිෂ්‍යත්වය**

බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයෙන් වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය

2010719 පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි

## ශාස්ත්‍රපති උපාධි- 2009

01. **කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි ත්‍යාගය**

මුල් බුදුසමය-විවරණ ගැටළු ප්‍රශ්න පත්‍රයෙන් වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
පූජ්‍ය මඩුගස්තලාවේ නන්ද හිමි (20098138)
පූජ්‍ය බැරගම සුමන හිමි (20098057)

02. **භාතිය දියස් ධීරසේකර ත්‍යාගය**

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙන් වැඩි ම ලකුණු ලැබූ පැවිදි ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
පූජ්‍ය මාපලගම නන්දසිරි හිමි (20098103)

03. **එච්.එස්. කුරේ අනුස්මරණ ශාස්ත්‍රපති උපාධි කුසලතා ත්‍යාගය**

බෞද්ධ සමාජ දර්ශනයේ මූලධර්ම ප්‍රශ්න පත්‍රයෙන් වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
Ven. Panahaduwe Yasassi (20098071)

## ශාස්ත්‍රපති උපාධි - 2010

01. **කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි ත්‍යාගය**

මුල් බුදුසමය-විවරණ ගැටළු ප්‍රශ්න පත්‍රයෙන් වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
රණවීර ආරච්චිලාගේ භාගිනී කුමාරි රණවීර (20098050)

02. **භාතිය දියස් ධීරසේකර ත්‍යාගය**

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙන් වැඩි ම ලකුණු ලැබූ පැවිදි ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
Rev. Shanta Shobhana (20108128)

03. **එච්.එස්. කුරේ අනුස්මරණ ශාස්ත්‍රපති උපාධි කුසලතා ත්‍යාගය**

බෞද්ධ සමාජ දර්ශනයේ මූලධර්ම ප්‍රශ්න පත්‍රයෙන් වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වෙනුවෙන් පිරිනැමෙන ත්‍යාගය
Rev. Shanta Shobhana (20108128)

## දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව - 2010

01. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන නාහිමි ත්‍යාගය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් මෙම ශිෂ්‍යත්වය ආරම්භ කර ඇත. ඒ ඒ වසරවල දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාවේ වැඩිම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට පිරිනැමීම සඳහා මෙම ශිෂ්‍යත්වය පිහිටුවන ලදී. ත්‍යාගයේ වටිනාකම රු. 5000/- ක් වේ. ඒ ඒ වසරට අදාළ මුදලක් වශයෙන් ප්‍රදානය කෙරේ. ප්‍රථම ස්ථාන දෙකක් හිමි වන්නේ නම් රු. 2500/- බැගින් බෙදා ප්‍රදානය කරනු ලැබේ.

2010 වර්ෂයේ දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාවේ වැඩිම ලකුණු ලබාගත් පහත නම් සඳහන් ශිෂ්‍යාවට මෙම ත්‍යාගය පිරිනැමේ.

ඉලන්දාවර්ණ හර්ෂා ශිරෝමිනී (DB/DS/2010/0426)

# 06. පුස්තකාල පහසුකම්

## කාර්ය මණ්ඩල සංයුතිය

| | |
|---|---|
| පුස්තකාලයාධිකාරී | 01 |
| සහකාර පුස්තකාලයාධිකාරී | 01 |
| මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා) | 02 |
| පුස්තකාල සහකාර | 01 |
| පුස්තකාල සහකාර (තාවකාලික) | 01 |
| පුස්තකාල සහායක | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු | 02 |

## පරිහරණය කළ පාඨක සංඛ්‍යාව

| | |
|---|---|
| උපාධි අපේක්ෂකයන් | 430 |
| ආචාර්ය මණ්ඩලය | 35 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 75 |
| පර්යේෂකයන් | 25 |

## වර්ෂය තුළදී අත්කරගත් ප්‍රතිග්‍රහණ

| | |
|---|---|
| මිළදීගත් පොත් සංඛ්‍යාව | - 1047 |
| පොත් මිළදී ගැනීමට වැයවූ මුදල | - රු. 977,024.54 |
| පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත්/සගරා ගණන | - 117 |
| පරිත්‍යාගවල වටිනාකම | - රු. 24,771.00 |

## 2011 වර්ෂය සඳහා දායකත්වය ලබාගත් සගරා

ටයිම් සගරාව සඳහා 2011 ජුලි මාසයේ සිට 2012 ජුලි මාසය දක්වා වර්ෂයක කාලයක් සඳහා දායක මුදල් ගෙවා ඇත.

දායක මුදල - රු. 10206.00

# 07. පරිපාලන කාර්ය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 01. | මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර- | | මහෝපාධ්‍යායයන් වහන්සේ |
| 02. | ආර්.ඒ. පියරත්න මහතා | - | ලේඛකාධිකාරී |
| 03. | ජී. ජයතිස්ස මහතා | - | නියෝජ්‍ය ලේඛකාධිකාරී |
| 04. | ඊ.ඒ. ගුණසේන මහතා | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| 05. | පී.පී. ප්‍රනාන්දු මිය | - | මූල්‍යාධිකාරී |
| 06. | එච්.ඒ.පී.පී. කරුණාරත්න මිය | - | සහකාර මූල්‍යාධිකාරී |
| 07. | එන්.ඒ.එස්.කේ. ප්‍රේමචන්ද්‍ර මහතා | - | සහකාර ලේඛකාධිකාරී |
| 08. | පූජ්‍ය බී. ධීරානන්ද හිමි | - | සහකාර ලේඛකාධිකාරී (2009.08.24 දින සිට) |
| 09. | ජී.ටී. කරුණාතිලක මිය | - | වැඩ ඉංජිනේරු |
| 10. | මල්කා හේවාවිතාරණ මිය | - | සහකාර ලේඛකාධිකාරී |

# සහාය පරිපාලන කාර්ය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 01. | පූජ්‍ය එන්. යෝගානන්ද හිමි | - | උපනේවාසිකාගාර පාලක |
| 02. | ගාමිණි සමරප්පුලිගේ මහතා | - | උපනේවාසිකාගාර පාලක |

2011 වර්ෂය තුළ කරන ලද බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැනීම, ප්‍රසූත නිවාඩු, වැටුප් රහිත නිවාඩු ගැනීම්, සේවය අත්හිටුවීම් හා පරිවාස කාලය දීර්ඝ කිරීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

## බඳවා ගැනීම්

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01. | පී.පී. ප්‍රනාන්දු මිය | මූල්‍යාධිකාරී | 2011.01.03 |
| 02. | ජී.ටී. කරුණාතිලක මිය | වැඩ ඉංජිනේරු | 2011.02.03 |
| 03. | ජේ.එම්. ගයානි උදේශිකා මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.08.01 |
| 04. | ඒ.එම්. සන්ධ්‍යා කුමාරි අතපත්තු මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.08.01 |
| 05. | ඩබ්.එම්.අයි.බී.කේ. වික්‍රමසිංහ මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.09.01 |
| 06. | එම්. හේවාවිතාරණ මිය | සහකාර ලේඛකාධිකාරී | 2011.11.14 |
| 07. | ආර්.ඒ.අයි.කේ. රණසිංහ මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.11.01 |
| 08. | එච්.එල්. උදය ජයනාත් මයා | කම්කරු (III ශ්‍රේණිය) | 2011.11.01 |

## ස්ථිර කිරීම

| | | |
|---|---|---|
| 01. | ඩී. උදිත මහේෂ් ප්‍රනාන්දු මයා | කම්කරු (III ශ්‍රේණිය) |
| 02. | ඩබ්.එම්. නයනප්‍රිය වීරසිංහ මයා | කම්කරු (III ශ්‍රේණිය) |

## සේවයෙන් ඉල්ලා අස්වීම

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01. | ඒ.එම්. සන්ධ්‍යා කුමාරි අතපත්තු මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.12.01 |
| 02. | ඩබ්.එම්.අයි.බී.කේ. වික්‍රමසිංහ මෙය. | ලිපිකරු (III ශ්‍රේණිය) | 2011.09.14 |
| 03. | එම්.එන්.ඒ. පීරිස් මයා | වැඩ පරිපාලක-සිවිල් | 2011.12.31 |

## විශ්‍රාම ගැනීම

2011 වර්ෂය තුළ කිසිවෙකුගේ සේවයෙන් විශ්‍රාම ගැනීමක් නොවී ය.

## සේවයෙන් මුදා හැරීම

01. එච්.ඩී. රසික කරුණාරත්න මයා සහකාර ලේඛකාධිකාරී 2011.01.03

## ප්‍රසූත නිවාඩු

2011 වර්ෂය තුළ කිසිවෙකු ප්‍රසූත නිවාඩු ගැනීමක් සිදු නොවී ය.

## වැටුප් රහිත නිවාඩු

එච්.ඩබ්. නෙල්සන් ජයලත් මයා කම්කරු (III ශ්‍රේණිය) 2011.01.09

## සේවයෙන් ඉවත් කිරීම

2011 වර්ෂය තුළ කිසිවෙකු සේවයෙන් ඉවත් කිරීමක් සිදු නොවී ය.

## පරිවාස කාලය දීර්ඝ කිරිම

2011 වර්ෂය තුළ කිසිවෙකුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමක් නොවී ය.

## 2011 වර්ෂය තුළ උසස්වීම්

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය
    2009.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහාචාර්ය තනතුරට උසස් කරන ලදී. (පුරාවිද්‍යා අධ්‍යයනාංශය)

## සේවයෙන් නිදහස් කිරීම්

2011 වර්ෂය තුල කිසිවෙකුගේ සේවයෙන් නිදහස් කිරීමක් නොවී ය.

## සේවයෙන් ඉවත් වීම්

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

01. එස්.පී. සමරවික්‍රම මහතා පරිගණක උපදේශක (II ශ්‍රේණිය) 2011.08.18
02. ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා ආධුනික කථිකාචාර්ය 2011.10.03

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය

මෙම වර්ෂය තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් අය උසස්වීම් ලබන ලදී.

01. එම්.ජී. රවීන්ද්‍ර දීපලාල් මයා විදුලි කාර්මික 2008.10.01

02. එම්.ජී.ඩබ්. වීරතුංග මයා උද්‍යාන කම්කරු 2001.08.14

| | | | |
|---|---|---|---|
| 03. | විජේරත්න හෙට්ටිආරච්චි මයා | යන්ත්‍ර ක්‍රියාකරු | 2001.08.14 |
| 04. | නිමල් සමරසිංහ මයා | යන්ත්‍ර ක්‍රියාකරු | 2001.08.14 |
| 05. | කේ.ඩී. උපුල් ඉන්දික මයා | කම්කරු | 2009.10.05 |
| 06. | හසිත කුමාර සමරප්පුලිගේ මයා | කම්කරු | 2009.08.04 |
| 07. | විමල් ජයසිංහ මයා | කම්කරු | 2009.08.04 |
| 08. | ඩී.වී.එන්. සේනාරත්න මයා | කම්කරු | 2009.12.15 |

## සප්ත වාර්ෂික නිවාඩු

| | | |
|---|---|---|
| 01. | මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන හිමි - | 2009.02.01දින සිට 2011.02.01 දින දක්වා |
| 02. | මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි | 2009.06.15 දින සිට 2011.01.17 දින දක්වා |
| 03. | මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි | 2010.07.22 දින සිට 2011.04.11 දින දක්වා |

## අධ්‍යයන නිවාඩු - විදේශීය

| | | |
|---|---|---|
| 01. | පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි (ආධුනික කථිකාචාර්ය) | විදේශීය අධ්‍යයන නිවාඩු ලබා සිට අධ්‍යයන නිවාඩු කාලය අවසන් වී ඇතිබැවින් 2011.07.18 දින නැවත සේවයට වාර්තා කර ඇත |

## අධ්‍යයන නිවාඩු - දේශීය

2011 වර්ෂය තුළ දේශීය අධ්‍යයන නිවාඩු ලබා ගෙන නොමැත.

## සේවයේ ස්ථිර කිරීම

| | | |
|---|---|---|
| 01. | පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි (ආධුනික කථිකාචාර්ය) | 2011.04.26 දින පැවති පාලක සභාවෙන් 2005.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි කථිකාචාර්ය තනතුරේ සේවය ස්ථිර කර ඇත |

## විදේශගතවීම්

01. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ)
    2011.02.24 - 2011.02.25 දින දක්වා
    (අවමංගල්‍ය උත්සවයකට සහභාගි වීම සඳහා සිංගප්පූරුවට යාම)

02. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ)
    2011.04.05 - 2011.04.09 දින දක්වා
    (ඉන්දියානු තානාපති කාර්යාලයෙන් වියට්නාමයේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා සහභාගී වීමට)

03. මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා (මහාචාර්ය) - 2011.08.09 - 2011.08.20 දින දක්වා (පෞද්ගලික කටයුත්තක් සඳහා නේපාලයේ මනිපල් වෛද්‍ය විද්‍යාලයට යාම සඳහා)

04. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ)
2011.09.13 - 2011.09.15 දින දක්වා
(තායිලන්තයේ සම්මන්ත්‍රණයක් සඳහා සහභාගි වීමට)

05. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)
2011.10.20 - 2011.10.24 දින දක්වා
සිංගප්පූරුවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන විභාග රාජකාරි සඳහා සහභාගි වීම සඳහා)

06. මහාචාර්ය පූජ්‍ය නෙළුවේ සුමනවංස හිමි (මහාචාර්ය)
2011.10.20 - 2011.10.26 දින දක්වා
මැලේසියාවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන විභාග රාජකාරි සඳහා සහභාගි වීම සඳහා)

07. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ)
2011.10.20 - 2011.10.26 දින දක්වා
ඔස්ට්‍රියාවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන විභාග රාජකාරි සඳහා සහභාගි වීම සඳහා)

08. ටී.එම්.ඩබ්.පී. තෙන්නකෝන් මිය (ආධුනික කථිකාචාර්ය)
2011.11.20 - 2011.11.29 දින දක්වා
පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා මැලේසියාවට යාම

09. පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි (ආධුනික කථිකාචාර්ය)
2011.12.01 - 2011.12.25 දින දක්වා
සිංගප්පූරුවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන විභාග රාජකාරි සඳහා සහභාගි වීම සඳහා)

10. සමන්ත ඉලංගකෝන් මහතා(ආධුනික කථිකාචාර්ය)
2011.11.17 - 2011.11.21 දින දක්වා
ඉන්දියාවේ පැවැත්වෙන සූෆී වාදය පිලිබඳ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වීම

11. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ)
2011.12.25 - 2011.12.30 දින දක්වා
සිංගප්පූරුවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන උත්සවයක් සඳහා සහභාගි වීම)

## පත් කිරීම

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 01. | පූජ්‍ය ගෝණදෙනියේ පඤ්ඤාරතන හිමි | ආධුනික කථිකාචාර්ය | 2011.01.03 |
| 02. | ටී.එම්.ඩබ්.පී. තෙන්නකෝන් මිය | ආධුනික කථිකාචාර්ය | 2011.01.03 |
| 03. | එම්.නිපුනිකා සඳමාලි දිලානි මිය | ආධුනික කථිකාචාර්ය | 2010.02.01 |
| 04. | යූ.ජී.එම්.සී. මනෝරි සමරකෝන් මෙය. | සහකාර පුස්තකාලයාධිකාරිනි | 2010.02.01 |

**අනධ්‍යයන තාවකාලික කාර්ය මණ්ඩලය**

01. ජේ.එම්. ගයානි උදේශිකා මෙය.ලිපිකරු (III ශ්‍රේණිය) 2011.02.07 දින සිට

02. පී.නුවන් සමරසිංහ මහතා කම්කරු (III ශ්‍රේණිය) 2011.08.17 දින සිට

03. පී.ආර්.සී.එස්. ජයසුන්දර මහතා ලිපිකරු (III ශ්‍රේණිය) 2011.08.15 දින සිට

04. එල්.එච්.වයි. වසන්ති මෙනවිය ලිපිකරු (III ශ්‍රේණිය) 2011.06.11 දින සිට

05. ඩබ්.ජ්. අනුරාධා නදීෂා වේරගල මෙය. ලිපිකරු (III ශ්‍රේණිය)2011.11.15 දින සිට

06. බී.කේ. පුලස්තික සම්පත් ජිනදාස මහතා පුස්තකාල සහකාර (III ශ්‍රේණිය)2011.12.13 දින සිට

07. ජේ.එච්.ජ්.රොෂානි චමින්දිකා ජයසිංහ මෙය. පරිගණක යෙදුම් සහකාර (III ශ්‍රේණිය) 2011.12.14 දින සිට

08. එච්.පී.ඩී. මුනේන්ද්‍ර මහතා කම්කරු (III ශ්‍රේණිය) 2011.08.12 දින සිට

09. ඩී.ඩී. සිදන්ත මයා කම්කරු (III ශ්‍රේණිය) 2011.07.02 දින සිට

**පීඨ පත්වීම්**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - 2011.09.26 දින සිට 2014.09.25 දින දක්වා

## තාවකාලික පදනම මත අධ්‍යයන කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම්

### භාෂා අධ්‍යයන පීඨය

| අධ්‍යනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| පාලි | 02 |
| සංස්කෘත | 01 |
| සිංහල | 01 |

**බෞද්ධ අධ්‍යයන පීඨය**

| අධ්‍යනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ දර්ශනය | 02 |
| බෞද්ධ සංස්කෘතිය | 02 |
| සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | 02 |
| පුරාවිද්‍යාව | 02 |

# 08. කාර්ය මණ්ඩල පුහුණු

## අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය වැඩමුළු

2011 වර්ෂයේ මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා සඳහා යොමු කරන ලදී. වෘත්තීය සංවර්ධන වැඩ මුළු 08ක් පවත්වා ඇත.

| වැඩ මුළු අංකය | දිනය | විශේෂ සම්පත් දායකත්වය | තේමාව |
|---|---|---|---|
| 55 | 2011.02.09 | තාවකාලික කථිකාචාර්ය නිලන්ත පී. දිසානායක මහතා | සමායන්තර ප්‍රයාණය හමුවේ ශ්‍රී ලාංකීය බෞද්ධ සමාජය මුහුණ දී ඇති අභියෝග පිළිබඳ විමර්ශනයක් |
| 56 | 2011.03.09 | ආධුනික කථිකාචාර්ය කේ.ජී. ස්වර්ණානන්ද මහතා | What's to be: "big frog in a small well or small frog in a big well". Characteristics of good teacher (A bilingual presentation) |
| 57 | 2011.04.06 | ආධුනික කථිකාචාර්ය සමන්ත ඉලංගකෝන් මහතා | ක්ලෝනීකරණය ආචාර්ය ධර්ම හා බෞද්ධ චින්තනය |
| 58 | 2011.05.11 | තාවකාලික කථිකාචාර්ය එච්.ඩබ්.බී. අයි. සම්පත් මහතා | ආනන්ද සමරකෝනුවන් විසින් ප්‍රාරබ්ධ සිංහල ගීත කලාව පිළිබඳ විග්‍රහයක් |
| 59 | 2011.06.08 | ආධුනික කථිකාචාර්ය එම්.එච්. පී.කේ. ගුණසේන මහතා | How to improve Presentation Skills |
| 60 | 2011.08.17 | තාවකාලික කථිකාචාර්ය පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන හිමි | The Date of Conception in the womb of a mother |
| 61 | 2011.09.07 | තාවකාලික කථිකාචාර්ය පූජ්‍ය කට්ටකඩුවේ චන්දවිමල හිමි | Commit Suicide: A Buddhist Perspective |
| 62 | 2011.10.20 | ආධුනික කථිකාචාර්ය නිපුනිකා සඳමාලි මිය | Motivation of the Students of the Buddhist and Pali University of Sri Lanka to Learn English |

## කාර්ය මණ්ඩල පුහුණු

2011 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා සඳහා යොමු කරවන ලදී.

ඒ සඳහා රු. 98,400/-ක මුදලක් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැය කරන ලදී. සහභාගී වුවන්ගේ නම් පහත දැක්වේ.

| නම හා තනතුර | පාඨමාලාවේ නම | ගාස්තුව | කාලය |
|---|---|---|---|
| එච්.පී. වීරසිංහ මිය<br>සහකාර අභ්‍යන්තර විගණක | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | රු. 8,800/- | |
| ජේ.ඩී. හපුතන්ත්‍රි මහතා<br>රියදුරු I ශ්‍රේණිය | ආරක්ෂිත විද්‍යාත්මක වාහන භාවිතය | රු. 2,500/- | 2011.07.30 |
| එච්.ඒ. ලාල් ජයරත්න මහතා<br>රියදුරු I ශ්‍රේණිය | | රු. 2,500/- | ” |
| එච්.ඒ. නලින් පෙරේරා මහතා<br>රියදුරු II ශ්‍රේණිය | | රු. 2,500/- | ” |
| බී.ජී. සුමතිපාල මහතා<br>රියදුරු II ශ්‍රේණිය | | රු. 2,500/- | ” |
| කැලුම් ජයලත් ද කොස්තා මහතා<br>රියදුරු II ශ්‍රේණිය | | රු. 2,500/- | ” |
| බන්දුල කුමාර මහතා<br>රියදුරු II ශ්‍රේණිය | | රු. 2,500/- | ” |
| ආර්.ඒ. පියරත්න මහතා<br>ලේඛකාධිකාරී | Training Programme on Office Automation Using Information Technology | රු. 10,000/- | 2011.08.08-<br>2011.08.12 |
| ජී.ටී. කරුණාතිලක මිය<br>වැඩ ඉංජිනේරු | බර යන්ත්‍රෝපකරණ භාවිතය හා ඵළදායිතාවය | රු. 2,500/- | 2011.09.29 |
| එම්.එන්.ඒ. පීරිස් මහතා<br>වැඩ පරිපාලක-සිවිල් | බර යන්ත්‍රෝපකරණ භාවිතය හා ඵළදායිතාවය | රු. 2,500/- | ” |
| ජී.ටී. කරුණාතිලක මිය<br>වැඩ ඉංජිනේරු | වතුර පොම්පයේ හා වායු පීඩන යන්ත්‍රයේ නඩත්තුව | රු. 9,000/- | 2011.10.18-<br>2011.10.22 |
| එම්.එන්.ඒ. පීරිස් මහතා<br>වැඩ පරිපාලක-සිවිල් | වතුර පොම්පයේ හා වායු පීඩන යන්ත්‍රයේ නඩත්තුව | රු. 9,000/- | ” |
| කේ.ඒ.එල්.ආර්. පෙරේරා මහතා<br>ජලනල කාර්මික I ශ්‍රේණිය | වතුර පොම්පයේ හා වායු පීඩන යන්ත්‍රයේ නඩත්තුව | රු. 9,000/- | ” |
| කේ.ඩී. උපුල් ඉන්දික මහතා<br>කම්කරු III ශ්‍රේණිය | වතුර පොම්පයේ හා වායු පීඩන යන්ත්‍රයේ නඩත්තුව | රු. 9,000/- | ” |
| චින්තක සමින්ද පීරිස් මහතා<br>කම්කරු III ශ්‍රේණිය | වතුර පොම්පයේ හා වායු පීඩන යන්ත්‍රයේ නඩත්තුව | රු. 9,000/- | ” |
| එච්. ඩී. ප්‍රේමරත්න ජයවීර මහතා<br>මාණ්ඩලික සහකාර පුස්තකාල සහකාර | ලේඛණ සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | රු. 2,000/- | 2011.03.30-<br>2011.03.31 |
| රංග බුද්ධික කංකානම්ගේ මහතා<br>පුස්තකාල සහායක | | රු.2,000/- | |
| චින්තක සමින්ද පීරිස් මහතා<br>කම්කරු III ශ්‍රේණිය | ඩීසල් ජෙනරේටර් නඩත්තුව පිළිබඳ පාඨමාලාව | රු.9,000/- | 2011.12.05-<br>2011.12.09 |
| පී.පී. ප්‍රනාන්දු මිය<br>මූල්‍යාධිකාරී | Seminar on Budget proposals - 2012 | රු. 800/- | 2011.12.12 |
| එච්.ඒ.පී.පී. කරුණාරත්න මිය<br>සහකාර මූල්‍යාධිකාරී | | රු. 800/- | |

# 09. මිලදී ගැනීම්

ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම - භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම - 2011 රු.13,020,934.40.

# 10. මිලදී ගැනීම්, ඉදිකිරීම් සහ පහසුකම් සැපයීම

2011 වර්ෂය තුළ මිල දී ගැනීම්, ඉදිකිරීම්, වැඩි දියුණු කිරීමේ හා පහසුකම සැපයීම සඳහා පහත සඳහන් පරිදි මුදල් ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| 1. | ස්ථාවර වත්කම් වැඩි දියුණු කිරීම | | |
| 1.1 | ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | රු. | 39,000,000.00 |
| 2. | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | |
| 2.1 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | රු. | 13,000,000.00 |
| 2.2 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | රු. | 79,500,000.00 |
| 2.3 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | රු. | 4,500,000.00 |
| 2.4 | පුස්තකාල පොත් | රු. | 3,684,000.00 |
| 2.5 | වාහන | රු. | 20,500,000.00 |
| 2.6 | යන්ත්‍ර උපකරණ හා සුළු උපකරණ | රු. | 1,000,000.00 |
| | | | 161,184,000.00 |

2011 වර්ෂයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ පහසුකම් සැපයීම රු. 4,263,841.00.
2011 වර්ෂයේ රඳවා ගැනීම් නිදහස් කිරීම රු. 587,921.19.

## Turn Key ක්‍රමය යටතේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති

ක්‍රියා යෝග්‍ය පදනම මත රු. මිලියන 512ක වටිනාකමැති ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලින් 93.45% ක් පමණ නිමකර ඇති අතර ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 98% කින් නිමකර ඇත. නමුත් මෙතෙක් නිසි ලෙස බාර දී නොමැත.

# 11. අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

හෝමාගම කාර්මික විද්‍යාලය, ගම්පහ කාර්මික විද්‍යාලය හා මරදාන කාර්මික විද්‍යාලය ගිණුම්කරණය, ලේකම් පරිචය, පරිගණක යෙදුම් සහායක පාඨමාලා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 06 දෙනෙකු, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා හෝමාගම කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ ලේකම්කරණය, පරිගණක පිලිබඳ පාඨමාලා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 34 දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.

## 12. මහපොළ ශිෂ්‍යත්ව

2011 අධ්‍යයන වර්ෂයට සිසුන් බඳවා ගැනීමේ දී උපරිම ලකුණු සීමාව සැළකිල්ලට ගෙන විද්‍යාර්ථීන් 67 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. 2011 වසරේ දී පළමු වසරේ සිසුන් 22 දෙනෙකුට ද, දෙවන වසර සිසුන් 21 දෙනෙකුට ද, තෙවන වසර සිසුන් 16 දෙනෙකුට ද, සිව්වන වසර සිසුන් 08 දෙනෙකුට ද මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

## 13. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් හා පීඨ සංගම් පිහිටුවීම

2011 පෙබරවාරි 22 දින රැස් වු ශිෂ්‍යයන් 2011.02.22 දින සිට වසරක් දක්වා පහත සඳහන් නිලධාරින් මඩුල්ල පත් කර ඇත.

| | | |
|---|---|---|
| 01. | පුජ්‍ය පානම ආනන්ද හිමි | සභාපති |
| 02. | පුජ්‍ය අස්මඩලේ ධම්මරතන හිමි | උප සභාපති |
| 03. | පුජ්‍ය විජේරියේ විමල හිමි | ලේකම් |
| 04. | හතිරින්ගේ සුසාන්ත පුෂ්පකුමාර මහතා | කණිෂ්ඨ භාණ්ඩාගාරික |
| 05. | පුජ්‍ය කතරගම මහින්ද හිමි | සගරා සංස්කාරක |
| 06. | පුජ්‍ය ගුරුවල සුසීල හිමි | සගරා සංස්කාරක |
| 07. | පූජ්‍ය නවදගල නාගිත හිමි | කාරක සභික |
| 08. | පූජ්‍ය මඩවල අරියරතන හිමි | කාරක සභික |

**පීඨ රැස්වීම් සඳහා ශිෂ්‍ය නියෝජිතයන් පත් කිරීම**

**භාෂා අධ්‍යයන පීඨය**

01. පුජ්‍ය මඩවල අරියරතන හිමි
02. පුජ්‍ය ගල්ලැල්ලේ ධමම්දින්න හිමි

**බෞද්ධ අධ්‍යයන පීඨය**

01. පුජ්‍ය අස්මඩලේ ධම්මරතන හිමි
02. පුජ්‍ය ගුරුවල සුසීල හිමි

# 14. උපකරණ උපයෝජනය

| උපකරණය | උපකරණ සංඛ්‍යාව | පරිභෝජනය කළ ඉන්ධන ප්‍රමාණය ලීටර් | වැය වූ මුදල රු. | ධාවනය කළ හැකි පැය ගණන | පැය 1 කට වැය වන මුදල රු. | පැය 1 කට වැය වන ප්‍රමාණය ලීටර් |
|---|---|---|---|---|---|---|
| විදුලි ජනක යන්ත්‍රය | 01 | ඩීසල් 900 | 74,400.00 | 89 | 835.96 | 10.11 |
| තණකොළ කපන යන්ත්‍රය | 03 | පෙට්‍රල් 135<br>2T 11<br>146 | 7,550.00<br>4,240.00<br>21,790.00 | 195 | 111.74 | 0.75 |
| එකතුව | 04 | 1046 | 96,190.00 | 284 | 947.70 | 10.86 |

# 15. මූල්‍ය කටයුතු

වර්ෂයේ මුළු ආදායම රු. 105,698,820 ක් වූ අතර එයින් 92,318,939 ක් පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ දායකය විය. බාහිර ව්‍යාපෘති වලින් 2011 වර්ෂය තුළ රු. 6,928,175 ක වියදමක් දරා ඇත. ස්ථාවර වත්කම් සඳහා වූ වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු. 40,240,200 ද ඇතුලත් සම්පූර්ණ පුනරාවර්තන වියදම රු. 167,070,369 ක් විය. එය ඉකුත් වර්ෂයේ සම්පූර්ණ පුනරාවර්තන වියදම වූ රු. 135,008,700 කට වඩා සියයට 23.75 කින් වැඩිවීමකි. ඒ අනුව වර්ෂයේ ඌණතාවය වූ රු. 61,546,736 පොදු සංචිතයට හර කළ පසු පොදු සංචිතයේ සමුච්චිත හර ශේෂය 2011.12.31 දිනට රු. 274,947,739 කි.

2011 වර්ෂයේ මූලධන වියදම් සඳහා රජයෙන් ලැබුණු දායකය රු. 30,500,000ක් වූ අතර 2011 වර්ෂයේ දී මූලධන වියදම් සඳහා රු. 23,637,554 ක් වැය කර ඇත.

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(ආසන්න රුපියලට ගැලපුම් කර ඇත.)

| 2010 | විස්තරය | උපලේඛන අංකය | | 2011 |
|---|---|---|---|---|
| රු. | | | රු. | රු. |
| | **වත්කම්** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| 529,461,004 | 1. ස්ථාවර වත්කම් | 01 | 510,719,381 | |
| | 2. මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම | 02 | 3,527,542 | |
| 14,815,554 | 3. ආයෝජන | 03 | 15,981,158 | |
| - | 4. ගබඩා තොග ගිණුම - මූලධන | | 564,000 | **530,792,081** |
| **544,276,558** | | | | |
| | **5. ජංගම වත්කම්** | | | |
| 383,450 | සේවා තැන්පත් | 04 | 383,450 | |
| 1,113,234 | මූලධන අත්තිකාරම් | 05 | 1,228,473 | |
| 310,367 | කලින් ගෙවීම් | 06 | 373,632 | |
| 173,527 | ලැබිය යුතු පොලී | 07 | 161,832 | |
| 28,010 | ආරක්ෂක ඇප තැන්පත් ආයෝජන | - | 29,439 | |
| 420,486 | ප්‍රකාශන තොගය | 08 | 420,486 | |
| 2,607,763 | සේවක ණය හා විවිධ අත්තිකාරම් | 09 | 2,529,996 | |
| 781,114 | ගබඩාවේ ඉතිරි තොගය | - | 1,443,624 | |
| 7,500 | ගෑස් සිලින්ඩර් සඳහා තැන්පතු | - | 7, 500 | |
| 27,129,594 | බැංකුවේ ශේෂය | 10 | 35,433,746 | |
| **32,955,045** | | | **42,012,178** | **42,012,178** |
| **577,231,603** | **මුළු වත්කම්** | | | **572,804,259** |
| | **6. ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| 733,404,735 | මූලධන ආධාර | 11 | 765,105,258 | |
| - | ණය හිමියෝ | - | 564 , 000 | |
| 875,935 | බාහිර ව්‍යාපෘති - මූලධන | - | 999,299 | |
| 1,100,000 | පොදු සංචිතයෙන් දැරූ මූලධන වියදම් | 12 | 1,100,000 | **767,768,557** |
| **735,380,670** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | **7. සංචිත** | | | |
| (213,401,003) | සමුච්චිත ශේෂය | - | (274,947,739) | |
| 3,179,996 | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම | - | 3,419,996 | |
| **(210,221,007)** | | | | **(271,527,743)** |
| 16,345,305 | **8. සංචිත අරමුදල්** | 13 | 17,851,774 | |
| 11,664,567 | **9. ප්‍රාග්ධන පරිත්‍යාග** | 14 | 11,689,338 | |
| - | **10.**සේවා පාරිතෝෂික දීමනා වෙන් කිරීම | - | 17,569,053 | **47,110,165** |
| **28,009,872** | | | | |
| | **11. ජංගම බැරකම්** | | | |
| 737,715 | තැන්පත් | 15 | 617,143 | |
| 570,786 | විවිධ ණය හිමියෝ | 16 | 207,052 | |
| 12,329,892 | කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | 17 | 12,926,599 | |
| 10,423,675 | බාහිර පාඨමාලා ව්‍යාපෘති | 18 | 15,702,486 | |
| **24,062,068** | | | **29,453,280** | **29,453,280** |
| **577,231,603** | **මුළු ප්‍රාග්ධනය හා වගකීම්** | | | **572,804,259** |

**මහෝපාධ්‍යාය**
**පිටිපන උතුර,**
**හෝමාගම.**

**මූල්‍යාධිකාරී**

2012.02.27

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදායම් හා වියදම් ගිණුම

| 2010 | විස්තරය | උපලේඛන අංකය | | 2011 |
|---|---|---|---|---|
| රු. | | | රු. | රු. |
| | **(01) ආදායම්** | | | |
| 82,170,000 | 1. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර | | 92,318,939 | |
| 9,873,793 | 2. විශ්වවිද්‍යාලය ඉපැයූ ආදායම | අ | 13,379,881 | |
| 5,637,083 | 3. බාහිර ව්‍යාපෘතිවලින් ලද ආදායම | | 6,928,175 | |
| 1,200,527 | 4. මූලධන-පුනරාවර්තන වියදම් | | - | |
| **98,881,403** | | | | **112,626,995** |
| | **(02) අඩුකළා - වියදම්** | | | |
| - | 1. විශ්වවිද්‍යාලයීය වියදම | | | |
| 41,161,272 | වැඩසටහන් අංක 01 | ආ | 52,376,203 | |
| 32,441,276 | වැඩසටහන් අංක 02 | ඇ | 46,283,776 | |
| 4,681,321 | වැඩසටහන් අංක 03 | ඈ | 6,952,769 | |
| 6,058,292 | වැඩසටහන් අංක 04 | ඉ | 6,120,708 | |
| 2,100,709 | වැඩසටහන් අංක 05 | ඊ | 2,530,028 | |
| 8,844,444 | වැඩසටහන් අංක 06 | උ | 12,566,685 | |
| 39,924,628 | 2. වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය | | 40,415,387 | |
| 5,637,083 | 3. බාහිර ව්‍යාපෘති වියදම | | 6,928,175 | |
| 1,200,527 | 4. මූලධන-පුනරාවර්තන වියදම් | | - | |
| **142,049,552** | | | | **174,173,731** |
| (43,168,149) | ආදායමට වැඩි වියදම | | | (61,546,736) |
| (170,232,854) | පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | (213,401,003) |
| **(213,401,003)** | ශේෂය ඉ/ගෙ | | | **(274,947,739)** |

**මහෝපාධ්‍යාය**

**මූල්‍යාධිකාරී**

**පිටිපන උතුර,**
**හෝමාගම.**
**2012.02.27**

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පසුගිය වසරේ අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූල ව හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ව ඓතිහාසික පිරිවැය පදනම මත ගිණුම් වාර්තා සකස් කර ඇත.
2. ගිණුම් වාර්තා අවසාන රුපියලට පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.
3. ගබඩා ද්‍රව්‍ය ප්‍රථම ගැණුම්, ප්‍රථම නිකුත් කිරීමේ පදනම මත අගය කර ඇත.
4. වි.වි.ප්‍ර.කො. සභා චක්‍රලේඛ අංක 649 අනුව ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ක්ෂය කර ඇති අතර, ශුද්ධ අගය මත ශේෂ පත්‍රයෙහි දක්වා ඇත. ක්ෂය කර ඇති ස්ථාවර වත්කම්වල ක්ෂය ප්‍රතිශතය පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 05% | පුස්තකාල පොත්පත්, සඟරා | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% | මෝටර් වාහන | 20% |
| කාර්යාල උපකරණ | 20% | උපාධි ලෝගු | 20% |

5. විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ රුපියල් මිලියන 512 ක් වූ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ක්‍රියා යෝග්‍ය පදනම (TURNKEY) යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා ඇත
6. 2010 වර්ෂයේ සිට බාහිර විභාග අංශය සඳහා 6.1 නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.
7. සේවා පාරිතෝෂික දීමනා සඳහා මූල්‍ය ප්‍රතිපාදන 2011 වර්ෂයේ සිට වෙන් කර ඇත.

මූල්‍යාධිකාරී
පිටිපන උතුර,
හෝමාගම.
2012.02.27

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2011

| | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | | |
| වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය) | | | **(43,168,149)** | | **(61,546,736)** |
| **මූල්‍යමය නොවන අයිතම සඳහා ගැලපීම** | | | | | |
| වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය | | | **39,924,628** | | **40,415,387** |
| පාරිතෝෂික වෙන් කිරීම | | | **-** | | **17,569,053** |
| | | | **(3,243,521)** | | **(3,562,296)** |
| | | | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | | | | |
| මූලධන අත්තිකාරම් | වැඩිවීම (අඩුවීම) | **7,473,170** | | **(115,239)** | |
| සේවා තැන්පතු | වැඩිවීම (අඩුවීම) | **-** | | **-** | |
| විවිධ ණය ගැතියන් | වැඩිවීම (අඩුවීම) | **-** | | **-** | |
| කළින් ගෙවීම | වැඩිවීම (අඩුවීම) | **220,163** | | **(63,265)** | |
| ලැබිය යුතු පොළී | වැඩිවීම (අඩුවීම) | **65,205** | | **11,695** | |
| ආරක්ෂක ඇප තැන්පත් | වැඩිවීම (අඩුවීම) | **(1,366)** | | **(1,429)** | |
| ප්‍රකාශණ තොගය | වැඩිවීම (අඩුවීම) | **-** | | **-** | |
| සේවක ණය හා අත්තිකාරම් | වැඩිවීම (අඩුවීම) | **(40,938)** | | **77,767** | |
| ගබඩාවේ ඉතිරි තොගය | වැඩිවීම (අඩුවීම) | **92,627** | | **(662,510)** | |
| තැන්පතු | වැඩිවීම (අඩුවීම) | **234,117** | | **(120,572)** | |
| විවිධ ණය හිමියෝ | වැඩිවීම (අඩුවීම) | **(407,388)** | | **(363,734)** | |
| කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | වැඩිවීම (අඩුවීම) | **(139,401)** | | **596,707** | |
| බාහිර පාඨමාලා ව්‍යාපෘති | වැඩිවීම (අඩුවීම) | **3,504,247** | **11,000,436** | **5,278,811** | **4,638,231** |
| | | | **7,756,915** | | **1,075,935** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | | | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | | **35,426,043** | | **21,673,764** | |
| ආයෝජනවල යෙදවීම | | **(741,467)** | | **1,165,604** | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | **-** | | **3,527,542** | |
| **ඉදිරියට ගෙන ගිය ශේෂය** | | | **26,927,661** | | **25,167,611** |

| | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | | | **26,927,661** | | **25,167,611** |
| **මූලධන ක්‍රියාකාරකම්** | | | | | |
| මූලධන දායකය | | **45,799,477** | | **31,700,523** | |
| සංචිත අරමුදල් | | **1,101,712** | | **1,506,469** | |
| ප්‍රාග්ධන පරිත්‍යාග | | **175,443** | | **24,771** | |
| ප්‍රත්‍යා ගණන ලාභය | | **-** | | **240,000** | |
| මූලධන ක්‍රියාකාරකම්වලින් ලැබීම | | | **47,076,632** | | **33,471,763** |
| **මුදල් සහ සමාන විෂයයන්ගේ ශේෂය** | | | **20,148,971** | | **8,304,152** |
| | | | | | |
| **මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය** | | | | | |
| වර්ෂය මුල | | | **6,980,623** | | **27,129,594** |
| වර්ෂය අග | | | **27,129,594** | | **35,433,746** |
| මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය වැඩිවීම (අඩුවීම) | | | **20,148,971** | | **8,304,152** |

මූල්‍යාධිකාරී

2012.02.27

සීඊ/ඊ/බීපීයූ/එෆ්ඒ/11

2012 ජුනි 30

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2012 අප්‍රේල් 19 වන දින නිකුත්කරන ලදී.

### 1. 2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පෙදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම් ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර්ය ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්

වේ. තොරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදනම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම් ද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1. 4 තත්ත්වාගණන කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම් ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්ව හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා නමුත් සම්පූර්ණයෙන් ක්ෂය වූ ලෙස ගිණුම්වල දක්වා තිබුණු පිරිවැය රු.3,854,820/- ක් වූ දුව භාණ්ඩ, රු.837,096/- ක් වූ උපාධි ලෝගු හා රු. 17,894,148/- ක් වූ කාර්යාල උපකරණ යනාදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

ආ) විශ්වවිද්‍යාලය විසින් බාහිර පාඨමාලා ව්‍යාපෘති ආදායම් කාලපරිච්ඡේදය අනුව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම නිසා අවසන්ව තිබූ පාඨමාලා ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තව තිබූ රු.15,702,486/- ක මුදලක් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) 2011 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණයේදී පීඨ කාර්යාලයේ ඉතිරිව තිබූ රු.510,376/- ක ප්‍රකාශන තොග අත්හැරී තිබුණු අතර අනෙකුත් ප්‍රකාශන තොගය රු.271,450/- ක් ලෙස ගණනය කර තිබුණි. එහෙත් රු.420,486/- ක් වූ ප්‍රකාශන තොගයේ පොත් අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර රු.361,340/- ක් වූ වෙනස මූල්‍ය ප්‍රකාශනයෙහි ගැලපීම් කිරීමට කටයුතුකර නොතිබුණි.

ආ) වත්කම් නඩත්තු හා අලුත්වැඩියා කිරීම් සඳහා විශ්වවිද්‍යාලය විසින් දරන ලද රු.3,527,542/- ක පුනරාවර්ථන වියදම් "මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම්" යන ගිණුම් ශීර්ෂය යටතේ වැය කර එම වියදම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානය වන විට කොන්ත්‍රාත් සහ සැපයුම් මත වූ රඳවාගැනීම් වල වටිනාකම රු. 12,926,599/- ක් වූ අතර ඉන් වර්ෂ 2කට වඩා පැරණි නිරවුල් නොකළ ශේෂවල වටිනාකම රු. 11,501,967/- ක් විය.

### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (I) 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිමයෙන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවීම කළ යුතු වුවත් පසුගිය වර්ෂ දෙක තුළ අවස්ථා 12 කදී ලබා දී තිබූ රු.242,407/- ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (II) 756 | විශ්වවිද්‍යාලයේ රු.26,885,579/- ක් වූ දැව භාණ්ඩ හා රු.36,783,169/- ක් වූ උපකරණ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා මූල්‍ය ප්‍රකාශනයේ පැවැති ශේෂ තහවුරු කර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය 19 | රු.200,000/- කට වැඩි වාහන අළුත්වැඩියා කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් වර්ෂය තුළ එසේ කටයුතු නොකළ අවස්ථා 3ක් අනාවරණය වූ අතර එහි වටිනාකම රු. 1,220,240/- ක් විය. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදලට සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2011 අගෝස්තු දක්වා රු. 4,155,912/- ක මුදල වැඩිපුර ගෙවා තිබුණි. |

### 2.2.5 ප්‍රමාණත්වක් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1984 නොවැම්බර් 24 දිනැති අංක PE/1/116/6 දරන භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ලිපිය අනුව වෛද්‍යාධාර අරමුදල සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් කෙරෙන දායකය අඩුකර ගැනීම සඳහා වෛද්‍යාධාර අරමුදල් ස්ථාවර තැම්පතු වල යෙදීමෙන් ලැබීම් පොලී ආදායම් ගැලපීමෙන් අනතුරුව වූ ශේෂය පමණක් ප්‍රතිපූර්ණය කරගත යුතු බවට උපදෙස් දී තිබුණ ද ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද එසේ ලද පොලී ආදායම වූ රු.169,152/- ක මුදල ගැලපීමෙන් තොරව මුලු දායකය වූ රු.1,512,940/- ක් වෛද්‍යාධාර අරමුදලට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී වෛද්‍යාධාර අරමුදලට රු.169,152/- ක් වැඩියෙන් බැර කර තිබුණි.

### 2.2.6 අවිධිමත් ගනුදෙනු

1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන අනුව අදාළ අනුමැතීන් ලබා ගැනීමකින් තොරව බාහිර විභාග අංශයේ නිලධාරීන් වෙත 2010/2011 වර්ෂ තුළ දීමනා ලෙස රු.534,600/- ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සාමලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.154,471,836/- ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ ඊට අනුරූප ඌනතාවය රු.125,338,149/- වූ යෙන් ඌනතාවයේ රු.29,133,687/- ක වැඩි වීමක් නිරීක්ෂනය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 92,318,939/- ක් වූ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.62,152,897/- ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.43,168,149/- ක් වූයෙන් ඌනතාවයේ වැඩිවීම රු.18,984,748/- ක් විය සමාලෝචිත වර්ෂයේ සිට සේවක පාරිතෝෂික වෙන් කිරීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

විශ්වවිද්‍යාලය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම වන අතර සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ හතරකදී සාමාන්‍ය උපාධි සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ඉල්ලුම් කල හා බඳවා ගත් දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලුම් කල සංඛ්‍යාව | | බඳවා ගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| 2007 | 348 | 42 | 102 | 42 |
| 2008 | 293 | 61 | 109 | 61 |
| 2009 | 196 | 74 | 109 | 74 |
| 2010 | 353 | 45 | 109 | 45 |
| 2011 | 305 | 48 | 110 | 48 |

### 4.2 අධ්‍යයන කාර්ය සාධනය

පහත කරුණු අනාවරණය විය.

අ) දර්ශනපති උපාධියෙහි පාඨමාලා කාලය වර්ෂ 02 ක් වුවත් 1994-2007 දක්වා ලියාපදිංචි වී සිටි ශිෂ්‍යයින් 22 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී උපාධිය ලබා ගත් අවස්ථා 08 ක් ද, උපාධිය ලබා නොගත් අවස්ථා 14 ක් ද නිරීක්ෂණය විය.

ආ) දර්ශනපති හා ආචාර්ය උපාධිය සඳහා අයකරන ගාස්තු ලේඛන ගත කර නොතිබුණි. මේ හේතු නිසා ගාස්තු අයවීම් වල නිවැරදිතාවය සහ තවදුරටත් අයවිය යුතු ගාස්තු කොපමණ ද යන්න තහවුරු කර ගත නොහැකි විය.

ඇ) පුස්තකාල ගාස්තු ලෙස දර්ශනපති හා ආචාර්ය උපාධි හැදෑරීමේ දී මුදල් අයකරනු ලැබුවත් පුස්තකාල පරිශීලනය සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

### 4.3 ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 519 ක් වෙනුවෙන් දරන ලද මුලු පුනරාවර්තන වියදම රු.174,779,892/- ක් වූ අතර ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 544 ක් වෙනුවෙන් දරන ලද මුලු පුනරාවර්තන වියදම රු.142,049,552/- ක් විය. සමාලෝචිත වර්ෂයේ රු.336,763/- ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය ඉකුත් වර්ෂයේ රු.261,120/- ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය හා සසඳන විට 28.9% කින් වැඩි වී තිබුණි. මෙයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කැලණිය හා මොරටුව විශ්වවිද්‍යාල වල ඒක ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු.184,226/- හා රු.218,123/- ක් විය.

### 4.4 කළමනාකරණ අකාරක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ

අ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ විධිවිධාන සහ 2011 අයවැය මඟින් ඊට යෝජිත සංශෝධනයන්ට අනුව රාජ්‍ය ආයතනවල මාසිකව නිත්‍ය සේවා නියුක්ති ලාභ රු.50,000/- ක් හෝ වර්ෂයකට රු. 600,000/- කට වැඩියෙන් ලබන සේවා නියුක්තිකයින් 2011 වර්ෂයේ අප්‍රේල් 01 සිට උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ලියාපදිංචි කර, බදු අඩු කර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු වුව ද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය විසින් මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

ආ) අංක 45 හා 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව 2011 වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 25 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා වශයෙන් රු. 2,986,806/- ක් ගෙවා තිබුණි.

ඇ) අංක 723 හා 1997 දෙසැම්බර් 12 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 12 (II) වගන්තියේ විධිවිධානයන්ට අනුව සහාය මහාචාර්ය/මහාචාර්ය උසස්වීම් ලබාදීමේදී ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස අදාළ ආයතනයෙන් බැහැර ප්‍රවීනයන් මෙන්ම අදාළ නිලධාරියාගේ ආචාර්යවරයෙකු නොවන තැනැත්තෙකු පත් කළ යුතු වුවත් ආයතනයේ බාහිර කථිකාචාර්යවරුන්, තවකාලික කථිකාචාර්යවරුන් හා විශ්වවිද්‍යාලයේ පාලක සභාව නියෝජනය කරන සාමාජිකයින් ඇගයීම් කමිටු සඳහා පත් කිරීමෙන් 2009 වර්ෂය තුල ලබා දී තිබූ සහාය මහාචාර්ය/මහාචාර්ය පත්වීම් 05ක් චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව හා විනිවිදභාවයකින් තොරව ලබා දී තිබූ බව නිරීක්ෂණය කෙරේ.

### 4.5 අරමුදල් ඌන උපයෝජනය

මූලධන වියදම් දැරීම සඳහා පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුමේ රු. මිලියන 18 සිට රු. මිලියන 40 දක්වා පරාසයක ශේෂයක් වර්ෂය පුරා තිබුණි. මෙම අතිරික්ත මුදල් කෙටිකාලීන තැන්පතුවල යෙදවීමෙන් ආදායමක් උපයාගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

### 4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) රු. මිලියන 97 ක් වැය කර ඉදිකරන ලද වර්ගඵලය වර්ගමීටර 3,881 පුස්තකාලයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 519කි. පුස්තකාලය සතු පොත් ගණන 39,040ක් විය. සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාලය දෛනික පරිහරණය සිසුන් සංඛ්‍යාව 14 සිට 99 දක්වා ඉතා පහළ මට්ටමක විය.

ආ) රු. මිලියන 28ක් වැය කර අංග සම්පූර්ණ ශ්‍රවනාගාරයක් ඉදිකර ඇතත් එය පරිහරණය සම්බන්ධයෙන් සැලසුම් විගණනයට ඉදිරිපත් නොකළ අතර එපරිදිම සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගෙන නොතිබුණු බව ද නිරීක්ෂණය විය.

ඇ) 2004 වර්ෂයේ සිට රු. මිලියන 512ක් වැය කර සියළු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණ ද ඊට සාපේක්ෂව වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

**4.7 පර්යේෂණ මඟින් දැනුම වර්ධනය කිරීම.**

පර්යේෂණ පැවැත්වීම තුළින් දැනුම වර්ධනය කර ශිෂ්‍ය ප්‍රජාව සමාජයට මුදාහැරීම විශ්වවිද්‍යාලයක ප්‍රධාන මෙහෙවරක් වුවත් සමාලෝචිත වර්ෂයේදී ජියුන් බෞද්ධ පර්යේෂණ ප්‍රකාශන අරමුදල කිසිදු පර්යේෂණ හා ප්‍රකාශන කටයුත්තක් සඳහා උපයෝජනය කර නොතිබුණු අතර එහි සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු. 1,732,347/- ක් විය.

**4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති.**

වොලිබෝල් ක්‍රීඩා පිටියක් (Volleyball Court) සකස් කිරීම සඳහා ලිඛිත ගිවිසුමකට නොඑළඹ 2010 ජූලි 08 දින රාජ්‍ය ආයතනයක් වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 241,810/- ක් ලබා දී තිබුණ ද වැඩ ආරම්භ කර නොතිබුණි. ප්‍රමාද වූ කාලය මාස 17ක් විය.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය.**

සමාලෝචිත වර්ෂය අවසානය වන විට විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ, අනධ්‍යයන තනතුරු 25 ක් හා අධ්‍යයන තනතුරු 07ක් වශයෙන් පුරප්පාඩු 32ක් පැවතිණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.**

විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර ඊට අනුකූලව සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණු අතර සංයුක්ත සැලැස්මේ අරමුණු හා ඉලක්ක ළඟා කර ගත හැකි ආකාරයට වාර්ෂික අයවැය සකස් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්.**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) පුස්තකාල කළමනාකරණය
(ඇ) ඉදිකිරීම්
(ඈ) මූල්‍යමය වටිනාකමක් ඇති ලියකියවිලි පිළිබඳ අභ්‍යන්තර පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) බාහිර ව්‍යාපෘති වලට අදාළ ගිණුම්කරණය
(උ) අත්තිකාරම් පියවීම

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

බීපීයූ/ඒබී-03/36(2011)

2013.04.02

එච්. ඒ. එස්. සමරවීර මහතා,
විගණකාධිපති.
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

**උක්ත විගණකාධිපති වාර්තාව 2012.11.14 දින පැවති මෙම විශ්වවිද්‍යාලයේ 330 වන පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම පිළිතුරු සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ අනුව නැවත 2013.03.25 දින පැවැති අංක 334 වන පාලක රැස්වීමේදී සළකා බලන ලදුව සංශෝධිත පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

**1.3 විගණකගේ වගකීම**

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**(අ)** දැනට සමීක්ෂණ මණ්ඩල මගින් වත්කම් සත්‍යාපනයක් කරනු ලබන අතර, එම වාර්තා පාලන අධිකාරිය වෙත ලැබූ විගස ප්‍රත්‍යාගණනයට ඉදිරිපත් කළ යුතු භාණ්ඩ හඳුනාගෙන කමිටුවක් පත් කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ තුළින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලබන බව දැනුම් දෙමි.

**(ආ)** දැනට බාහිර ව්‍යාපෘතිවලින් ලැබෙන මුදල් වියදම් කළ යුතු ආකාරය පිළිබඳව නිර්ණායකයක් මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර ඒ සඳහා නිර්දේශය ලබාගෙන ඇති අතර එම නිර්ණායක පාලක සභාව වෙත ඉදිරිපත් කර අනුමත වූ විගස භාණ්ඩාගාරය වෙත දැන්වීමටත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කිරීමට සටහන් කර ගත් බව දන්වා සිටිමි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** මෙම මාර්ගස්ථ තොගය මාර්ගස්ථ තොග ගිණුමකට මාරු කිරීමටත්, අවසන් තොගයේ වටිනාකම නිවැරදිව පෙන්වීමටත් කටයුතු කරන බව දැනුම් දෙමි.

**(ආ)** 2012 වර්ෂයේ සිට මෙම මූලධන නොවන වත්කම් නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ වියදම්, පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2012 අගෝස්තු වනවිට රු. 238,782.00ක මුදලක් 2010 හා 2011 වර්ෂවල කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් වලින් නිදහස් කර ඇත. නමුත් වර්ෂ දෙකට වඩා පැරණි රු. 11,501,967.00 තුළ CECB ආයතනය වෙත ගෙවීමට ඇති රැඳවුම් මිලියන 10.4ක මුදලක් පවතින අතර ගොඩනැගිලි වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉදිරියේදී එම මුදල් එම ආයතනයට ගෙවීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි රැඳවුම් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

**(i)** 371(2) වගන්තිය -

එම කාලපරිච්ඡේදය තුළ නොපියවා තිබූ සියලුම අත්තිකාරම් මේ වන විට පියවා අවසන් කර ඇති බව දන්වමි.

**(ii)** 756 වගන්තිය -

2011 කාර්යාලයීය උපකරණ හා ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු නිමකර වාර්තා ඉදිරිපත් කර ඇත. එම වාර්තා අනුව හෙළිදරව් වූ අතිරික්තතා හා ඌනතා සම්බන්ධව පසුවිපරම් කටයුතු සහ භාණ්ඩ අපහරණ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී.

**(ආ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය 19**

සීමාවන් ඉක්ම වූ වාහන අළුත්වැඩියා සම්බන්ධව අනුමැතිය ලබා ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇත.

**(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 955 අප විශ්වවිද්‍යාලයට අදාළ කර ගැනීමෙන් අනතුරුව අධ්‍යයන දීමනාව පදනම් කරගෙන අර්ථසාධක අරමුදල් දායකය කපා ගැනීම අත්හිටුවීමට කටයුතු කර ඇති අතර මේ වන විට එයට පෙර ගෙවා ඇති අධ්‍යයන දීමනාවට අදාළ අර්ථසාධක දායකය අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ඉදිරියේදී පාලක සභාව දැනුවත් කර එහි තීරණය පරිදි මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව තව දුරටත් දැනුම් දෙමි.

**2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

අදාළ ආයෝජන ආදායම් ලදුපත් අංක 128948 මඟින් විශ්වවිද්‍යාල ගිණුමට බැර කර ඇත.

**2.2.6 අවිධිමත් ගනුදෙනු**

මෙම විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා පශ්චාත් උපාධි අංශය තුළ බාහිර විභාග අංශය, පශ්චාත් උපාධි පීඨයට අදාළ සමස්ථ රාජකාරි ඉටුකෙරේ.

බාහිර විභාග අංශය මගින් පවත්වාගෙන යන පාඨමාලා සංඛ්‍යාව 14 කි. ලියාපදිංචි වී තිබූ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 7432 කි. ඒ අනුව අයදුම්පත් කැඳවා සිසුන් ලියාපදිංචියේ සිට පාඨමාලා පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, විභාග පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම ආදී සමස්ථ ක්‍රියාවලියම එකම අංශයකින් ඉටු කරනු ලැබේ. බාහිර විභාග අංශයේ නිලධාරීන් වෙත ගෙවන ගෙවීම් නැවත සමාලෝචනය කර සම්මත නිර්ණායක අනුව ගෙවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ඉල්ලුම් කරන සියලුම සිසුන් සුදුසුකම් සපුරා නොමැති බැවින් සුදුසුකම් සපුරා ඇති සිසුන් අතුරින් Z අගයේ ප්‍රමුඛත්වය මත බඳවා ගැනීම් සිදු කෙරේ. එහිදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා දී ඇත්තේ දේශීය සිසුන් 110ක් බඳවා ගැනීමට පමණි. එසේ සිසුන් 110ක් පමණක් බඳවා ගැනීමට අවසර ලබා දෙනු ලබන්නේ බඳවා ගන්නා සියලු ම සිසුන්ට සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 1995 අංක 37 දරණ සංශෝධිත පනත ප්‍රකාරව නේවාසික පහසුකම් ලබා දිය යුතු බැවිනි.

### 4.2 අධ්‍යයන කාර්ය සාධනය

(අ) පෙන්වා දී ඇති පරිදි හැකිතාක් දුරට නියමිත කාලය තුළ උපාධි සම්පූර්ණ කිරීමටත් ඒවා ගුණාත්මකව හා ඵලදායීතාවයකින්, තත්ත්ව පාලනයක් යටතේ ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.

(ආ) දැනට මෙම කාර්යයන් විධිමත්ව කරගෙන යාමට ක්‍රියාකර ඇත.

(ඇ) බාහිර විභාග අංශයේ පුස්තකාලය පරිශීලනය කරන සිසුන්ගේ ප්‍රමාණය වර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

### 4.3 ශිෂ්‍ය පිරිවැය

මෑතකාලයේදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නඩත්තු වියදම් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම නිසා ඒකක ශිෂ්‍ය පිරිවැය වැඩි වී ඇත.

### 4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) හිඟ බදු මුදල් ඉදිරියේදී ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පෙන්වා දී ඇති කරුණු පිළිබඳව අවධානය යොමුකර ඇත. මෙතෙක් භාර දී තිබූ පර්යේෂණ යෝජනාවල නොලැබී ඇති අවසාන පර්යේෂණ වාර්තා ලබා දීමට අදාළ ආචාර්යවරුන් දැනුවත් කර ඇති අතර ඒවා පර්යේෂණ කමිටුවලට යොමුකර අදාළ නිරීක්ෂණ ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

(ඇ) මෙම තත්ත්වය ඉදිරියේ දී ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 4.5 අරමුදල් ඌන උපයෝජනය

පෙන්වා දී ඇති දුර්වලතා මඟහරවා ගැනීමට සටහන් කර ගතිමි.

### 4.6 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

(අ)

පහත සඳහන් හේතු මත පුස්තකාලය පරිහරණය කළ ශිෂ්‍ය සංඛ්‍යාව ඇතැම් අවස්ථාවන්හි අවම වී ඇත.

- විවිධ විනය කඩකිරීම් හේතුවෙන් 2011.11.18 දිනැති ලිපිය පරිදි තාවකාලික ශිෂ්‍යභාවය අහෝසි වූ සිසුන්ගේ සංඛ්‍යාව 29ක් පමණ වේ.
- ඇතැම් මාසවල නිවාඩු කාල පරිච්ඡේද වීම මත ශිෂ්‍යයන් එම මාසවල විශ්වවිද්‍යාලයේ නොමැති වීම. උදා :
    - මැයි මස වෙසක් නිවාඩුව - 2011.05.14 දින සිට 2011.05.22 දින දක්වා.
    - අර්ධ වාර්ෂික පරීක්ෂණ අවසන් වීමෙන් ලැබෙන නිවාඩු - 2011.07.09 දින සිට 2011.07.24 දින දක්වා.

මෙම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා මේ වන විට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- පුස්තකාල පරිශීලනය අඩු වීම සම්බන්ධව පුස්තකාල කමිටුවේදී සියලුම අධ්‍යයනාංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත.
- පාඨක මිත්‍රශීලී පරිසරයක් ඇති කර පාඨක සේවාව සැපයීම සඳහා වරින්වර පුස්තකාල අභ්‍යන්තර කාර්ය මණ්ඩල රැස්වීම් වලදී කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.

**(ආ)** විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ ප්‍රධාන උත්සව (සාහිත්‍ය උත්සවය ඇතුළු) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල වල වැඩසටහන් සඳහා මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන ඇත. ඉදිරියේදී ශිෂ්‍ය සංඛ්‍යාව අනුව අභ්‍යන්තර සහ බාහිර උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීමට සැලසුම් කර ඇත. මීට අමතරව බුද්ධ ධර්ම හා පාලි ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සව පවත්වා ඇත.

**(ඇ)** විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් නො තිබූ අතර ඊට අදාළ පහසුකම් සංවර්ධනය කිරීම අවශ්‍යතම කොන්දේසියකි. නිදර්ශනයක් වශයෙන් එහිදී ආචාර්යවරුන්ට තම අධ්‍යයන කාර්යයන් කිරීමට අවශ්‍ය මූලික පහසුකම් ද නො තිබුණි. ඒ අනුව සියලු පහසුකම් සමබර වන පරිදි ගොඩනැගිලි හා යටිතල පහසුකම් දියුණු කර ඇත. ඉදිරියේදී සිසුන් වැඩිවශයෙන් බඳවා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

## 4.7 පර්යේෂණ මගින් දැනුම වර්ධනය කිරීම

පෙන්වා දී ඇති පරිදි පර්යේෂණ ක්‍රියාවලියට සිසුන් පොළඹවා නව දැනුම සමාජයට දායාද කිරීමට හැකිවන පරිදි මෙම ශිෂ්‍යත්ව ක්‍රමය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත.

## 4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති

වොලිබෝල් ක්‍රීඩා පිටිය තැනීමේ කටයුතු ක්‍රියායෝග්‍ය පදනම යටතේ විශ්වවිද්‍යාලයීය අනෙකුත් ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතම 2010/03 සුළු ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව පවරා ඇත.

ඒ අනුව 2010.07.28 වන දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ලෙස රු. 241,810.24 ක මුදලක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලබා දී ඇත. ඉන්පසු එම ආයතනය මගින් ක්‍රීඩා භූමියේ වැඩ ආරම්භ කිරීමෙන් අනතුරුව වොලිබෝල් ක්‍රීඩා භූමියට යාබද ඉඩමෙහි නිවාස සංකීර්ණයක් සෑදීමට කටයුතු ආරම්භ කරන ලද

බැවින්, වොලිබෝල් ක්‍රීඩා පිටියේ තැනීම් කටයුතු මේ වන විට නතර කර ඇත. අත්තිකාරම් වශයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා ඇති මුදල් අනෙකුත් ව්‍යාපෘති සඳහා ගෙවීමට ඇති මුදල් මගින් පියවා ගැනීමට කටයුතු කළ හැකි බව දන්වා සිටිමි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ) <u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>**

පුරප්පාඩුව පැවැති අනධ්‍යයන තනතුරු 25 න් , තනතුරු 17 ක් මේවන විට බඳවා ගෙන ඇත. පුරප්පාඩු තනතුරු 03ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. ඉතිරි තනතුරු 05 සඳහා බඳවා ගැනීම තාවකාලිකව නවතා ඇත.

**<u>අධ්‍යයන කාර්යමණ්ඩලය</u>**

කථිකාචාර්යවරුන්ගේ පවතින ඌනතාවය හේතුවෙන් මහාචාර්ය තනතුරු දෙක නොපුරවා ඒ වෙනුවට වෙන් ව ඇති ප්‍රතිපාදනවලින් තාවකාලික කථිකාචාර්යවරුන් බඳවා ගෙන වැඩි දේශන සංඛ්‍යාවක් පවත්වා විෂය නිර්දේශ ආවරණය කිරීමට කටයුතු කර ඇත. අනෙකුත් කථිකාචාර්ය පුරප්පාඩු වලට බඳවා ගෙන ඇත. පරිගණක උපදේශක 01ක් සඳහා අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණය පවත්වා 2012.09.18 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවාගෙන ඇත.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**(අ)** කොළඹ කොල්ලුපිටියේ පිහිටි මුම්තාස් මහල් ගොඩනැගිල්ල පිහිටි ඉඩම පාර්ලිමේන්තුව මගින් මෙම විශ්වවිද්‍යාලයට පැවරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලයේ බාහිර පාඨමාලා සියල්ල සඳහා පංති පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සහිත ගොඩනැගිලි ඉදිකිරීමටත් සැලසුම් කර තිබුණි. එහෙත් එම සැලසුම් ගොඩනැගිල්ල පිහිටි ඉඩම වෙනත් පාර්ශ්වයකට පවරා දීමට තීරණය කර තිබීමත් සමග වෙනස් කිරීමට සිදුවිය.

මෙහි ඇතුළත් ඇතැම් ව්‍යාපෘතීන් මේ වනවිට අහෝසි කිරීමට ක්‍රියා කර ඇති අතර ඇතැම් ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සංයුක්ත සැලැස්මෙහි සහ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇත.

විශ්වවිද්‍යාලයට ඉඩම් නොලැබීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේ වුවත් සංයුක්ත සැලැස්මේ කාර්ය සැලැස්මට අනුව අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටුකරවා ගැනීමට ක්‍රියාකරනු ඇත.

**6. පද්ධති හා පාලනයන්**

මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි.

**මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර**
**මහෝපාධ්‍යායයන් වහන්සේ**

පිටපත් : 01. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## අර්ථසාධක අරමුදල
## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සංඛ්‍යා ආසන්න රුපියලට ගැලපුම් කර ඇත.)

| 2010 රු. | විස්තරය | උපලේඛන අංකය | 2011 රු. | 2011 රු. |
|---|---|---|---|---|
| | **01. වගකීම්** | - | | |
| 34,152,623 | දායක ගිණුම - සේවක | 01 | 38,412,269 | |
| 51,230,880 | දායක ගිණුම - සේව්‍ය | 01 | 57,620,348 | |
| **85,383,503** | | | **96,032,617** | **96,032,617** |
| | **02. සංචිත** | - | | |
| 7,973 | සමුච්චිත ශේෂය | | | 7,957 |
| **85,391,476** | | | | **96,040,574** |
| | **නියෝජනය කරන්නේ** | | | |
| | **03. දිගුකාලීන වත්කම්** | - | | |
| 48,335,214 | භාණ්ඩාගාර බිල්පත් | | 67,688,441 | |
| 23,605,531 | සේවක ණය | 02 | 26,181,372 | |
| **71,940,745** | | | **93,869,813** | **93,869,813** |
| | **04. ජංගම වත්කම්** | - | | |
| 1,268,025 | ලැබිය යුතු පොලී | | 2,007,061 | |
| 191,095 | රඳවා ගැනීමේ බදු | | 61,789 | |
| 15,289,528 | බැංකුවේ ශේෂය | | 1,957,656 | |
| **16,748,648** | | | **4,026,506** | |
| | **05. අඩු කළා :** | | | |
| | **ජංගම බැරකම්** | - | | |
| 255,487 | උපචිත වියදම් | | 144,223 | |
| 3,042,430 | විවිධ ණයහිමියෝ | 03 | 1,711,522 | |
| **3,297,917** | | | **1,855,745** | |
| 13,450,731 | ශුද්ධ ජංගම වත්කම් | | 2,170,761 | 2,170,761 |
| **85,391,476** | | | | **96,040,574** |

මහෝපාධ්‍යාය
පිටිපන උතුර, හෝමාගම.

මූල්‍යාධිකාරී

2012.02.27

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අර්ථසාධක අරමුදල

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**<u>ආදායම් හා වියදම් ගිණුම</u>**

| 2010 රු. | විස්තරය | | 2011 රු. | රු. |
|---|---|---|---|---|
| | **01. ආදායම්** | - | | |
| 5,549,591 | භාණ්ඩාගාර බිල්පත් පොලී | | 5,115,357 | |
| | මිශ්‍ර ලැබීම් | | 1,300 | |
| **5,549,591** | දළ ආදායම | | **5,116,657** | **5,116,657** |
| | **02. අඩු කළා : වියදම්** | | | |
| 60,000 | විගණන ගාස්තු | | 4,566 | |
| - | වෙනත් වියදම් | | 3,750 | |
| **60,000** | | | **78,316** | **78,316** |
| | | | | **5,038,341** |
| | **අඩු කළා :** | | | |
| 554,959 | වර්ෂයේ ආදායම් බදු | | | 511,536 |
| **4,934,632** | ආදායම් බද්දට පසු අතිරික්තය | | | **4,526,805** |
| | **එකතු කළා :** | | | |
| 5,568 | පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | 7,973 |
| **4,940,200** | | | | **4,534,778** |
| | **අඩු කළා :** | | | |
| | විසර්ජනයන් | | | |
| | දායක ගිණුම් සඳහා පොලී | | | |
| 1,972,891 | සේවක | - | 1,810,728 | |
| 2,959,336 | සේව්‍ය | - | 2,716,093 | |
| **4,932,227** | | | **4,526,821** | **4,526,821** |
| 7,973 | ශේෂය ඉ/ගෙ | | | 7,957 |

මහෝපාධ්‍යාය — මූල්‍යාධිකාරී

පිටිපන උතුර, හෝමාගම.

2012.02.27

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# අර්ථසාධක අරමුදල
# 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | විස්තරය | ලෙජර් පිටුව | හර | බැර |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **1** | දායක ගිණුම - සේවක | **01-10** | - | 38,412,269 |
| **2** | දායක ගිණුම - සේව්‍ය | **01-11** | | 57,620,348 |
| **3** | සමුච්චිත ශේෂය | **02-10** | | 7,973 |
| **4** | ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | **03-10** | 67,688,441 | |
| **5** | සේවක ණය | **03-11** | 26,181,372 | |
| **6** | ලැබිය යුතු පොලී | **04-10** | 2,007,061 | |
| **7** | රඳවා ගැනීමේ බදු | **04-11** | 61,789 | |
| **8** | බැංකුවේ ශේෂය | **-** | 1,957,656 | |
| **9** | උපචිත වියදම් | **05-10** | | 144,223 |
| **10** | විවිධ ණයහිමියෝ | **05-11** | | 1,711,522 |
| **11** | ආයෝජන ආදායම් භාණ්ඩාගාර බිල්පත් | **06-10** | | 5,115,357 |
| **12** | දායක ගිණුම් සඳහා බැර කළ පොලිය | **07-10** | 4,526,821 | |
| **13** | ආදායම් බදු | **07-11** | 511,536 | |
| **14** | විගණන ගාස්තු | **07-12** | 74,566 | |
| **15** | වෙනත් වියදම් | **07-13** | 3,750 | |
| **16** | මිශ්‍ර ලැබීම් | **07-14** | - | 1,300 |
| | | | 103,012,992 | 103,012,992 |

මහෝපාධ්‍යාය

මූල්‍යාධිකාරී

පිටිපන උතුර,

හෝමාගම.

2012.02.27

සීඊ/ඊ/බීපියු/පීඑෆ්/එෆ්ඡ්/11

2012 මැයි 11

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,

**<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්සාධක අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අර්සාධක අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනයෙන් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 74 දරන දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන සහ මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර්ය ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණණ සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තොරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම් කරන ප්‍රතිපත්ති වල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වගට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ලැබිය යුතු ගිණුම්

වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය කළ මූල්‍ය ආයතනයක් විසින් ආදාළ ආයෝජන ආදායමෙන් නියමිත ප්‍රමාණය ඉක්මවා රු.191,095/-ක් රඳවා ගැනීමේ බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.61,789/-ක් නිරවුල් වී නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල ආදායම් බද්දට පෙර රු.5,038,341/-ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.5,489,591/-ක් වූයෙන් අතිරික්තයේ අඩුවීම රු.451,250/-ක් විය. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ප්‍රතිශතයන් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 කාර්යය සාධනය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවක අර්ථසාධක අරමුදල ස්ථිර සේවකයන්ගේ මාසික ඉපයීම් වලින් අයකරන 10%ක දායක මුදල හා විශ්වවිද්‍යාලය මඟින් එම ඉපයීම් මත ගෙවනු ලබන 15%ක දායක මුදලින් සමන්විත වේ. එම මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීම සහ සේවක ණය ලබා දීමට කටයුතු කරනු ලබයි.

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී කල්පිරී තිබූ එකතුව රු.52,200,000ක් වූ ආයෝජන නැවත ආයෝජනය කිරීමට ප්‍රමාද කිරීම හේතුවෙන් අරමුදලට රු.260,108ක පොලී අහිමි වී තිබුණි.

(ආ) අරමුදල් දායක ගිණුම් සඳහා බැර කරන ලද පොලී ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ රු.4,526,821ක් වූ අතර ඉකුත් වර්ෂයේ බැර කළ පොලී ප්‍රමාණය රු.4,932,227ක් වූයෙන් එහි 8.21%ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට විවිධ හේතුන් මත අදාළ ප්‍රතිලාභීන් 08 දෙනකු වෙත රු.1,711,522ක් ගෙවීම ප්‍රමාද වෙමින් තිබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණය ශේෂ නිරවුල් කිරීම.
(ආ) රඳවා ගැනීමේ බදු නිරවුල් කර ගැනීම.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

බීපීයූ/ඒබී-03/36(2011)

2013.01.08

එච්. ඒ. එස්. සමරවීර මහතා,
විගණකාධිපති.
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනකරණයේ වගකීම**

**1.3 විගණකගේ වගකීම**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ලැබිය යුතු ගිණුම්**

දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවයට නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් ප්‍රේෂණය කර තිබූ රඳවා ගැනීමේ බදු මුදල වන රු.191,095.09 ක මුදලින් රු.129,306/- ක මුදලක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ආපසු ගෙවූ අතර, ඉතිරි මුදල වූ රු.61,789.09 ක මුදල ලබා ගැනීම සඳහා ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාවේ කළමණාකරු සමඟ මූල්‍යාධිකාරීතුමිය විසින් සාකච්ඡා කළ අතර, ඔහුගේ එකඟතාවය මත ඒ පිළිබඳව විස්තර දන්වා ලිපියක් යවා ඇත. එයට ලැබෙන ප්‍රතිචාර මත එම මුදල ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
මේ වන තෙක් එයට ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් 2012.09.20 දින නැවත ඒ පිළිබඳව සිහිපත් කර සිහිකැඳවීමක් ද යවා ඇත.
2012.10.18 දින ද නැවත ෂෂ වන සිහිකැඳවීම ද යවා ඇත. පිළිතුරු ලැබී නොමැත.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

**3.2 කාර්යය සාධනය**

අ) ඉදිරිපත් කර ඇති සේවක ණය අයදුම්පත් සඳහා ණය ලබා දීමෙන් හා සේවයෙන් ඉවත් වූ, විශ්‍රාම ගිය, ඉල්ලා අස්වූ නිලධාරීන්ගේ ප්‍රතිලාභ නිදහස් කිරීමෙන් පසු ඉතිරි වූ මුදල් සියල්ල ප්‍රමාද නොකර නැවත ආයෝජනය කිරීමට කටයුතු කර ඇත.

ආ) සමාලෝචිත වර්ෂය තුළ සමස්ථයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් වල පොලී ප්‍රතිශතය අඩු වූ හෙයිනුත්, සේවක ණය වැඩිපුර අයදුම් කිරීම හේතුවෙන් වැඩිපුර ණය දීමට

සිදු වීමෙන් හා අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ වැඩිපුර නිදහස් කිරීමට සිදු වූ හෙයින් ආයෝජනය කිරීමට ඇති මුදල් ප්‍රමාණය අඩුවීමෙනුත් ඉකුත් වර්ෂයේ පොළි ප්‍රමාණයෙහි අඩුවීමක් දක්නට ලැබුණි.

ඇ)

- ඩී. එන්. නානායක්කාර මියගේ සේවක අර්ථසාධක අරමුදලින් 25%ක මුදල වන රු. 40,554.00 ක මුදල, ඇය විසින් ලිපිලේඛන හා බඩු බාහිරාදිය භාර දී නොමැති හෙයින් රඳවාගෙන ඇත. තවද ඇය නමින් ඉහළ උසාවියෙහි මේ වන විට නඩුවක් ද පැවැත් වේ.
- ආර්.එම්. චන්ද්‍රසිරි මහතාගේ රු. 622,779.00 ක මුදල සහ යූ.එස්. ප්‍රභාත් මහතාගේ රු. 396,155.00 ක මුදල දූනට ගොනු කර ඇති නඩු විභාග වෙමින් පවතින හෙයින් ඔවුන් විසින් භාරගෙන නොමැත.
- යූ.ඒ. ජයසිරි මහතාගේ 2008.03.01 දිනෙන් පසු උපයාගත් පොලිය වන රු. 84,175.00 ක මුදල 2012 ජ'නල් සටහන් අංක 09 මඟින් ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

  ඊට අමතරව 2008.03.01 දක්වා අර්ථසාධක අරමුදලට බැර වී ඇති මුදල වන රු. 365,286.16ක මුදල 2011.03.31 දින යූ.ඒ. ජයසිරි මහතාට ගෙවා ඇත.
- චාමින්ද උපුල් මහතා හට වැඩිපුර බැර කර ඇති පොලී මුදල වන රු. 21,399.00ක මුදල 2012 ජ'නල් සටහන් අංක 10 මඟින් විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීමට කටයුතු කර ඇත.
- 2011.11.30 දින සේවයෙන් ඉල්ලා අස් වූ යූ. සුසන්ත ජයරත්න මහතාගේ අර්ථසාධක අරමුදලේ ශේෂය වන රු. 328,490.00 ක මුදල 2012.01.24 දින නිදහස් කර ඇත.
- පූජ්‍ය පී. නන්ද හිමිගේ රු. 7,706.00 ක මුදල අර්ථසාධක අරමුදලට ආදායමට ගැනීමට මුදල් කමිටු පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.
- එන්. ඒ. එස්. කේ. ප්‍රේමචන්ද්‍ර මහතාගේ රු. 210,265.00 ක මුදල නිදහස් කිරීම පිළිබඳ ව නීතිපති උපදෙස් ලබා ගැනීමට යොමු කර තිබූ අතර මේ වන විට එම ගෙවීම් සඳහා උපදෙස් ලැබී ඇති බැවින් ඉදිරියේදී ගෙවීම් කළ හැක.

## 4. පද්ධති හා පාලන

පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට අවධානය යොමු කරමි.

**මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර**
**මහෝපාධ්‍යායයන් වහන්සේ**

# 16. උප ලේඛනය

1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත අනුව පත් කරන ලද මහෝපාධ්‍යායයන් වහන්සේලා

| | නම | තනතුර | සේවයට පත් වූ දිනය | සේවය අවසන් වූ දිනය |
|---|---|---|---|---|
| 01 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1982.01.15 | 1985.01.14 |
| 02 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1985.01.15 | 1988.01.14 |
| 03 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1988.01.19 | 1991.01.18 |
| 04 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1991.01.19 | 1994.01.18 |
| 05 | පූජ්‍ය අකුරටියේ නන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1994.01.19 | 1996.08.05 |

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමෙන් පසු පත් කරන ලද වැඩ බලන මහෝපාධ්‍යායයන් වහන්සේලා, නිසි බලධාරි හා මහෝපාධ්‍යායයන් වහන්සේලා

| | නම | තනතුර | සේවයට පත් වූ දිනය | සේවය අවසන් වූ දිනය |
|---|---|---|---|---|
| 01 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | බලධාරින් වහන්සේ | 1996.08.08 | 1996.12.31 |
| 02 | ආචාර්ය පූජ්‍ය හොරණ වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | බලධාරින් වහන්සේ | 1997.01.15 | 1997.02.23 |
| 03 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | වැඩබලන මහෝපාධ්‍යාය | 1997.02.24 | 1998.10.28 |
| 04 | ආචාර්ය පූජ්‍ය මීගොඩ පඤ්ඤාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | වැඩබලන මහෝපාධ්‍යාය | 1998.11.25 | 1999.01.20 |
| 05 | මහාචාර්ය පී. විල්සන් | නිසි බලධාරි | 1999.01.20 | 1999.09.30 |
| 06 | ආචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 1999.10.01 | 2002.09.20 |
| 07 | ආචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2002.09.21 | 2005.09.20 |
| 08 | මහාචාර්ය පූජ්‍ය වැගම පියරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2005.09.21 | 2008.09.20 |
| 09 | මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා | වැඩ බලන මහෝපාධ්‍යාය | 2008.09.24 | 2008.10.28 |
| 10 | මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2008.10.29 | මේ දක්වා |


## 1982 සිට 2011 දක්වා විශ්වවිද්‍යාලයට වෙන් වූ ප්‍රතිපාදන

| වර්ෂය | පුනරාවර්තන වියදම් මිලියන | ප්‍රාග්ධන වියදම් මිලියන |
|---|---|---|
| 1982 | 0.03 | 0.05 |
| 1983 | 0.15 | 0.02 |
| 1984 | 0.23 | 0.04 |
| 1985 | 0.32 | 0.04 |
| 1986 | 0.38 | 0.06 |
| 1987 | 0.37 | 0.02 |
| 1988 | 0.35 | 0.05 |
| 1989 | 0.39 | 0.01 |
| 1990 | 0.65 | 0.004 |
| 1991 | 0.72 | 0.31 |
| 1992 | 0.82 | 0.32 |
| 1993 | 1.04` | 0.08 |
| 1994 | 1.20 | 0.09 |
| 1995 | 1.28 | 0.20 |
| 1996 | 1.22 | 0.43 |
| 1997 | 1.37 | 2.0 |
| 1998 | 1.67 | 1.37 |
| 1999 | 1.78 | 0.51 |
| 2000 | 1.87 | 0.49 |
| 2001 | 2.30 | 0.38 |
| 2002 | 22.10 | 7.0 |
| 2003 | 27.74 | 11.39 |
| 2004 | 30.50 | 69.913 |
| 2005 | 38.00 | 180.00 |
| 2006 | 58.5 | 180.00 |
| 2007 | 66.8 | 133 |
| 2008 | 68.9 | 130 |
| 2009 | 79.34 | 127.5 |
| 2010 | 82.17 | 142.5 |
| 2011 | 83.5 | 161.184 |

## BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA

### Cadre Position for Non-academic Staff as at 31.12.2011


| Post | Cadre Approved | Cadre Filled | Vacancies |
|---|---|---|---|
| Registrar | 1 | 1 | 0 |
| Bursar | 1 | 1 | 0 |
| Deputy Registrar | 1 | 1 | 0 |
| Senior Asst. Registrar | 1 | 1 | 0 |
| Assistant Registrar | 3 | 1 | 2 |
| Internal Auditor (A-04) | 1 | 0 | 1 |
| Assistant Bursar | 1 | 1 | 0 |
| Personal Assistant | 1 | 0 | 1 |
| Sub-Warden | 2 | 2 | 0 |
| Clerk | 16 | 14 | 2 |
| Library Assistant | 4 | 3 | 1 |
| Works Supervisor | 1 | 0 | 1 |
| Steno/Typist (Sinhala/English) | 6 | 5 | 1 |
| Computer Application Assistant | 12 | 3 | 9 |
| Typist | 3 | 3 | 0 |
| Book Keeper | 1 | 1 | 0 |
| Shroff | 1 | 1 | 0 |
| Store-Keeper | 1 | 1 | 0 |
| Telephone Operator/Receptionist | 2 | 2 | 0 |
| Library Attendant | 2 | 1 | 1 |
| Driver | 7 | 7 | 0 |
| Cycle Orderly | 1 | 1 | 0 |
| Labourer Skilled (Electrical/Plumber) | 2 | 2 | 0 |
| Cook | 2 | 0 | 2 |
| Roneo Machine Operator | 2 | 2 | 0 |
| Machine Operator-Grass | 1 | 0 | 1 |
| Labourer | 20 | 20 | 0 |
| Labourer-Garden | 2 | 1 | 1 |
| Sanitary Labourer | 4 | 1 | 3 |
| Works Engineer | 1 | 1 | 0 |
| **Total** | **103** | **77** | **26** |




25
20
15
10
5
0
Registrar
Bursar
Deputy Registrar
Senior Asst. Registrar
Assistant Registrar
Internal Auditor (A-04)
Assistant Bursar
Personal Assistant
Sub-Warden
Clerk
Library Assistant
Works Supervisor
Steno/Typist (Sinhala/English)
Computer Application Assistant
Typist
Book Keeper
Shroff
Store-Keeper
Telephone...
Library Attendant
Driver
Cycle Orderly
Labourer Skilled...
Cook
Roneo Machine Operator
Machine Operator-Grass
Labourer
Labourer-Garden
Sanitary Laborer
Works Engineer
Cadre Approved
Cadre Filled
Vacancies

| Cadre Position for Academic staff 31.12.2011 - (Teaching) | | | |
|---|---|---|---|
| **Post** | **Cadre Approved** | **Cadre Filled** | **Vacancies** |
| Vice Chancellor | 01 | 01 | 00 |
| Professor | 02 | 00 | 02 |
| Senior Lecturer I/ Senior Lecturer II/ Lecturer/ Probationary Lecturer<br>*Associate Professor<br>* Professor | 29 | 21 | 08 |
| English Instructor | 01 | 00 | 01 |
| Computer Instructor Gr. II | 01 | 00 | 01 |
| Buddhist Councellor | 01 | 01 | 00 |
| | **35** | **23** | **12** |

* Associate Professor, * Professor – Promotion



| Cadre Position for Academic staff 31.12.2011 - (Non-Teaching) | | | |
|---|---|---|---|
| **Post** | **Cadre Approved** | **Cadre Filled** | **Vacancies** |
| Librarian | 01 | 01 | 00 |
| Assistant Librarian | 01 | 01 | 00 |
| | **02** | **02** | **00** |



## 2001 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂවල සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

| | පාඨමාලාව | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | බුද්ධ ධර්ම ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය ආයතන | <br>120<br>53 | <br>164<br>66 | <br>1085<br>137 | <br>575<br>114 | <br>1132<br>35 | <br>881<br>30 | <br>1077<br>40 | <br>924<br>71 | <br>614<br>82 | <br>603<br>89 | <br>322 |
| 02. | පාලි ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය ආයතන | <br>08<br>01 | <br>32<br>- | <br>75<br>නැත | <br>65<br>නැත | <br>74<br>09 | <br>97<br>නැත | <br>120<br>නැත | <br>77<br>-- | <br>78<br>- | <br>52<br>- | <br>22<br>- |
| 03. | සංස්කෘත ඩිප්ලෝමා - දේශිය | - | - | - | - | - | - | - | - | - | 11 | 03 |
| 04. | සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර උපාධිය)<br>දේශීය<br>විදේශීය ආයතන | <br>41<br>02 | <br>40<br>10 | <br>95<br>13 | <br>73<br>18 | <br>226<br>20 | <br>227<br>30 | <br>572<br>43 | <br>801<br>28 | <br>1060<br>09 | <br>627<br>10 | <br>3796<br>26 |
| 05. | සාමාන්‍ය ශාස්ත්‍රවේදී (අභ්‍යන්තර) උපාධිය<br>දේශීය<br>විදේශීය (අභ්‍යන්තර)<br>(ඉංග්‍රීසි මාධ්‍යය) | <br>50<br>07 | <br>50<br>30 | <br>50<br>18 | <br>60<br>38 | <br>239<br>103 | <br>100<br>64 | <br>110<br>42 | <br>109<br>61 | <br>109<br>74 | <br>109<br>45 | <br>110<br>48 |
| 06. | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය ආයතන - සිංගප්පූරුව<br>විදේශීය | <br>11<br>නැත | <br>02<br>01 | <br>07<br>නැත | <br>11<br>- | <br>22<br>- | <br>20<br>නැත | <br>27<br>- | <br>22<br>- | <br>24<br>- | <br>18<br>-<br>01 | <br>24<br>-<br>- |
| 07. | ඉංග්‍රීසි ඩිප්ලෝමා<br>සහතිකපත්‍ර පාඨමාලාව<br>මූලික පාඨමාලාව | - | - | - | - | - | 116<br>42<br>65 | 107<br>54<br>43 | 237<br>83<br>74 | 143<br>42<br>49 | 136<br>37<br>56 | 299<br>118<br>63 |
| 08. | ශාස්ත්‍රපති<br>දේශීය<br>විදේශීය ආයතන - සිංගප්පූරුව<br>විදේශීය ආයතන නොවන | <br>133<br>17<br>නැත | <br>106<br>නැත<br>15 | <br>102<br>නැත<br>21 | <br>83<br>නැත<br>14 | <br>73<br>නැත<br>56 | <br>88<br>17<br>30 | <br>82<br>08<br>97 | <br>113<br>නැත<br>28 | <br>144<br>නැත<br>22 | <br>158<br>-<br>63 | <br>181<br>33<br>13 |
| 09. | දර්ශනපති<br>දේශීය<br>විදේශීය ආයතන<br>විදේශීය | <br>14<br>නැත | <br>-<br>- | <br>05<br>02 | <br>01<br>03 | <br>20<br>- | <br>03<br>02 | <br>-<br>- | <br>01<br>03 | <br>10<br>- | <br>10<br>01<br>02 | <br>05<br>-<br>- |
| 10. | දර්ශනශූරී උපාධි<br>දේශීය<br>විදේශීය<br>විදේශීය ආයතන | <br>නැත<br>නැත | <br>**<br>** | <br>නැත<br>නැත | <br>නැත<br>නැත | <br>නැත<br>නැත | <br>01<br>නැත | <br>නැත<br>නැත | <br>**<br>**<br>- | <br>01<br>- | <br>07<br>02<br>- | <br>01<br>- |


# 1983 වසරේ සිට 2011.12.31 දින දක්වා ලියාපදිංචි වී තිබෙන ශිෂ්‍ය සංඛ්‍යාව

| වර්ෂය | ආචාර්ය උපාධිය | දර්ශනපති උපාධිය | ශාස්ත්‍රපති උපාධිය | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධිය (අභ්‍යන්තර) | සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධිය (බාහිර) | විශේෂ ශාස්ත්‍රවේදි උපාධිය | විදේශ ධර්මදූත සේවා පාඨමාලාව | ඉංග්‍රීසි ඩිප්ලෝමා (බාහිර) | බුද්ධ ධර්ම ඩිප්ලෝමා | පාලි ඩිප්ලෝමා | සංස්කෘත ඩිප්ලෝමා | ධර්ම සංනිවේදන ඩිප්ලෝමා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1983 | - | - | - | - | 134 | - | - | - | - | - | | | | - | 134 |
| 1984 | - | - | - | - | 10 | - | - | - | - | - | | | | - | 10 |
| 1985 | - | - | 20 | - | 21 | - | - | - | - | - | | | | - | 41 |
| 1986 | - | 02 | 14 | - | 26 | - | - | - | - | - | | | | - | 42 |
| 1987 | 02 | - | 22 | - | 27 | - | - | - | - | - | | | | - | 51 |
| 1988 | 03 | - | 25 | - | 73 | - | - | - | - | - | | | | - | 101 |
| 1989 | - | - | 40 | - | - | - | - | - | - | - | | | | - | 40 |
| 1990 | - | 04 | 68 | - | 88 | - | - | - | - | - | | | | - | 160 |
| 1991 | - | - | 89 | 25 | 97 | - | - | - | - | - | | | | - | 211 |
| 1992 | 01 | 03 | 187 | 10 | 312 | - | - | - | - | - | | | | - | 513 |
| 1993 | 03 | 02 | 298 | 12 | 72 | - | - | - | - | - | | | | - | 387 |
| 1994 | 02 | - | 199 | 10 | 312 | - | - | - | - | - | | | | - | 523 |
| 1995 | - | 12 | 400 | 02 | 79 | - | - | - | - | - | | | | - | 493 |
| 1996 | 02 | 13 | 256 | 03 | - | - | - | - | - | - | | | | - | 274 |
| 1997 | 02 | 11 | 335 | 10 | - | - | - | - | - | - | | | | - | 358 |
| 1998 | 02 | 12 | 229 | 12 | - | 57 | 76 | - | - | - | | | | - | 388 |
| 1999 | - | - | - | - | - | - | 44 | 12 | - | - | | | | - | 56 |
| 2000 | - | 04 | 140 | 19 | - | 50 | 61 | - | - | - | | | | - | 274 |
| 2001 | - | 14 | 150 | 11 | - | 57 | 43 | - | - | - | 173 | 09 | | - | 457 |
| 2002 | - | - | 121 | 03 | - | 80 | 50 | 20 | - | - | 230 | 32 | | - | 536 |
| 2003 | - | 07 | 123 | 10 | - | 68 | 108 | 36 | - | - | 1222 | 75 | | - | 1649 |
| 2004 | - | 04 | 97 | 11 | - | 98 | 91 | 21 | - | - | 689 | 65 | | - | 1076 |
| 2005 | - | 20 | 65 | 22 | - | 46 | - | 29 | - | 223 | 1167 | 83 | | - | 1655 |
| 2006 | 01 | 05 | 135 | 20 | - | 88 | 257 | 24 | 30 | 213 | 911 | 97 | | 46 | 1827 |
| 2007 | - | - | - | 27 | - | 99 | 615 | 42 | 17 | 204 | 1117 | 120 | | - | 2241 |
| 2008 | - | 04 | 141 | 22 | | 109 | 829 | 34 | 17 | 223 | 995 | 77 | | - | 2451 |
| 2009 | - | 04 | 192 | 24 | - | 90 | 1069 | 34 | - | 223 | 696 | 78 | | - | 2410 |
| 2010 | 09 | 13 | 21 | 19 | - | - | 637 | - | - | 229 | 734 | 54 | | - | 1716 |
| 2011 | 01 | 05 | 227 | 24 | - | 158 | 3822 | 33 | - | 480 | 322 | 22 | 04 | - | 5098 |

# 1984 වසරේ සිට 2011.12.31 දක්වා උපාධි ලබා ගත් සංඛ්‍යාව I

| වර්ෂය | 1. සාහිත්‍ය චක්‍රවර්ති සම්මාන උපාධිය | 2. ආචාර්ය උපාධිය | 3. දර්ශනපති උපාධිය | 4. ශාස්ත්‍රපති උපාධිය | 5. ජන සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 6. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 7. ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 8. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (අභ්‍යන්තර) | 9. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර) | 10. විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1984 | - | - | - | - | - | - | 1 | - | - | - | 1 |
| 1985 | 1 | - | - | 16 | - | - | - | - | - | - | 17 |
| 1986 | - | - | - | 11 | - | - | 32 | - | - | - | 43 |
| 1987 | - | - | - | 18 | - | - | 33 | - | - | - | 51 |
| 1988 | - | - | - | 17 | - | - | 26 | - | - | - | 43 |
| 1989 | 2 | - | 1 | 30 | 24 | - | 45 | - | - | - | 102 |
| 1990 | 2 | - | - | 50 | 20 | - | 44 | - | - | - | 116 |
| 1991 | 2 | 1 | 1 | 78 | 10 | 16 | 80 | - | - | - | 188 |
| 1992 | - | 1 | - | 156 | - | 5 | 30 | - | - | - | 192 |
| 1993 | - | - | 2 | 257 | - | 6 | 56 | - | - | - | 321 |
| 1994 | - | - | - | 174 | - | - | 70 | - | - | - | 244 |
| 1995 | - | - | - | 318 | - | 7 | 61 | - | - | - | 386 |
| 1996 | - | - | 3 | 176 | - | 1 | 116 | - | - | - | 296 |
| 1997 | - | 3 | 1 | 249 | - | 5 | 127 | - | - | - | 385 |
| 1998 | - | 1 | - | 190 | - | 8 | 62 | - | - | - | 261 |
| 1999 | - | - | - | 197 | - | 2 | 48 | - | 13 | - | 260 |
| 2000 | 1 | - | - | - | - | 5 | 6 | 35 | 8 | - | 55 |
| 2001 | - | 1 | 2 | 66 | - | 3 | 1 | 1 | 8 | 12 | 94 |
| 2002 | 2 | - | - | 63 | - | - | - | - | 24 | - | 89 |
| 2003 | - | - | 7 | 123 | - | 7 | - | 31 | - | - | 168 |
| 2004 | - | - | 2 | 63 | - | 7 | - | 27 | 23 | 19 | 141 |
| 2005 | 2 | - | 2 | 55 | - | 14 | - | 25 | 23 | 31 | 152 |
| 2006 | - | - | - | - | - | - | - | - | - | 18 | 18 |
| 2007 | - | 2 | 1 | 77 | - | 10 | - | 74 | 54 | 37 | 255 |
| 2008 | - | - | 1 | 67 | - | 6 | - | - | - | - | 74 |
| 2009 | 2 | - | - | 97 | - | 9 | - | - | 123 | - | 231 |
| 2010 | - | 2 | 2 | 109 | - | 12 | - | - | 126 | - | 251 |
| 2011 | 3 | - | 1 | 136 | - | 09 | - | - | ප්‍රතිඵල නිකුත් කර නොමැත | - | 4 |
| එකතුව | 17 | 11 | 26 | 2793 | 54 | 132 | 838 | 193 | 402 | 117 | 4583 |

***සටහන් :-***විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව අංක 5 සහ 7 හි සඳහන් උපාධි පාඨමාලා පවත්වනු නොලැබේ. 1984 වසරේ සිට 2008.12.31 දින දක්වා මෙම විශ්වවිද්‍යාලයෙන් බිහිකරන ලද මුළු උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 3915කි.



320
310
300
290
280
270
260
250
240
230
220
210
200
190
180
170
160
150
140
130
120
110
100
90
80
70
60
50
40
30
20
10
0
1984 1985 1986 1987 1988 1989 1990 1991 1992 1993 1994 1995 1996 1997 1998 1999 2000 2001 2002 2003 2004 2005 2006 2007 2008 2009 2010 2011
1. සාහිත්‍ය චක්‍රවර්ති සම්මාන උපාධිය
2. ආචාර්ය උපාධිය
3. දර්ශනපති උපාධිය
4. ශාස්ත්‍රපති උපාධිය
5. ජන සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා
6. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
7. ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
8. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (අභ්‍යන්තර)
9. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර)
10.විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය

II. 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂවල ඩිප්ලෝමා/උපාධි ලබා ගත් ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.


| | පාඨමාලාව | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| 01 | ශාස්ත්‍රවේදි (විශේෂ) උපාධිය (අභ්‍යන්තර)<br>දේශීය<br>විදේශීය | <br>21<br>01 | <br>26<br>01 | <br>29<br>04 | <br>30<br>07 | <br>45<br>02 | |
| 02 | ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධිය (අභ්‍යන්තර)<br>දේශීය<br>විදේශීය | <br>32<br>11 | <br>51<br>23 | <br>54<br>15 | <br>48<br>25 | <br>75<br>18 | |
| 03 | ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධිය (බාහිර)<br>දේශීය<br>දේශීය ආයතන නොවන<br>විදේශීය (සිංගප්පුරු ආයතනය) | <br>32<br>01<br>06 | <br>51<br>07<br>08 | <br>68<br>05<br>19 | <br>113<br>01<br>06 | <br>119<br>03<br>04 | ප්‍රතිඵල<br>නිකුත් කර<br>නැත |
| 04 | ශාස්ත්‍රපති උපාධිය<br>දේශීය<br>දේශීය ආයතන නොවන<br>විදේශීය (සිංගප්පුරු ආයතනය) | <br>56<br>25<br>12 | <br>54<br>14<br>10 | <br>57<br>16<br>- | <br>-<br>91<br>31 | <br>97<br>16<br>- | <br>136 |
| 05 | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය | <br>07<br>- | <br>10<br>- | <br>06<br>- | <br>09<br>- | <br>12<br>- | <br>09 |
| 06 | විදේශ ධර්මදූත සේවා පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය | <br>09<br>- | <br>-<br>- | <br>02<br>- | <br>-<br>- | <br>-<br>- | - |
| 07 | දර්ශනපති උපාධිය<br>දේශීය<br>විදේශීය<br>විදේශීය ආයතන නොවන | <br>-<br>- | <br>01<br>- | <br>-<br>- | <br>-<br>- | <br>02<br>-<br>01 | <br>01<br>-<br>- |
| 08 | ආචාර්ය උපාධිය<br>දේශීය<br>විදේශීය (සිංගප්පූරුව) | <br>-<br>- | <br>03<br>- | <br>-<br>01 | <br>-<br>- | <br>01<br>- | <br>-<br>- |
| 09 | පාලි ඩිප්ලෝමා පරීක්ෂණය<br>දේශීය<br>විදේශීය ආයතන නොවන<br>විදේශීය (සිංගප්පුරු ආයතනය) | <br>33<br>03<br>- | <br>41<br>02<br>- | <br>25<br>-<br>01 | <br>28<br>-<br>02 | <br>21<br>-<br>- | <br>8<br>-<br>- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | බුද්ධ ධර්ම ඩිප්ලෝමා පරීක්ෂණය | | | | | | |
| | දේශීය | - | 320 | 389 | 282 | 250 | 278 |
| | විදේශීය ආයතන නොවන | - | 03 | 05 | 01 | - | - |
| | විදේශීය (සිංගප්පූරු ආයතනය) | - | 10 | 14 | 25 | 17 | 21 |
| | විදේශීය (මැලේසියා ආයතනය) | - | - | 07 | 10 | 08 | 5 |
| | විදේශීය (ජර්මන් ආයතනය) | - | - | 11 | - | - | - |
| | විදේශීය (ඔස්ට්‍රියා ආයතනය) | | | | | | 5 |
| 11 | සංස්කෘත ඩිප්ලෝමා පරීක්ෂණය | | | | | 03 | - |
| | දේශීය | | | | | | |
| 12 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පරීක්ෂණය | | | | | | |
| | දේශීය | 45 | 79 | 101 | 59 | 120 | 178 |

## විදේශීය අනුබද්ධ ආයතන

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය යටතේ ලියාපදිංචිව පවත්වාගෙන යනු ලබන විදේශීය විශ්වවිද්‍යාලවල ආයතන පහත සඳහන් රටවල පිහිටුවා ඇත.

1. සිංගප්පූරුව
2. කොරියාව
3. ඔස්ට්‍රියාව
4. එංගලන්තය
5. ජර්මනිය
6. ඇමෙරිකාව



# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# රැස්වීම් පිළිබඳ දින දර්ශනය - 2011 වර්ෂය

| මාසය | පාලක සභාව | සනාතන සභාව | උසස් උපාධි කමිටුව | පීඨ මණ්ඩල රැස්වීම් | | මුදල් කමිටුව | ආයතනික ප්‍රසම්පාදන කමිටුව | සුළු ප්‍රසම්පාදන කමිටුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | බෞද්ධ අධ්‍යයන පීඨය | භාෂා අධ්‍යයන පීඨය | | | පළමු වර | දෙවන වර |
| | ප.ව 2.30 | ප.ව 2.00 | පෙ.ව 10.30 | පෙ.ව 9.00 ප.ව 1.00 | පෙ.ව 9.00 ප.ව 1.00 | ප.ව 2.00 | ප.ව 3.00 | පෙ.ව 9.30 | පෙ.ව 9.30 |
| ජනවාරි | 25 | 11 | 12 | 26 | 26 | 07 | 11 | 03 | 17 |
| පෙබරවාරි | 22 | 08 | 09 | 23 | 23 | 11 | 15 | 07 | 21 |
| මාර්තු | 29 | 08 | 16 | 23 | 23 | 11 | 15 | 07 | 21 |
| අප්‍රේල් | 26 | 08 | 20 | 27 | 27 | 08 | 05 | 04 | 18 |
| මැයි | 31 | 10 | 11 | 25 | 25 | 06 | 14 | 03 | 16 |
| ජුනි | 28 | 14 | 08 | 22 | 22 | 10 | 07 | 06 | 20 |
| ජූලි | 26 | 12 | 20 | 27 | 27 | 08 | 11 | 04 | 18 |
| අගෝස්තු | 30 | 09 | 17 | 24 | 24 | 12 | 11 | 08 | 22 |
| සැප්තැම්බර් | 27 | 13 | 21 | 28 | 28 | 09 | 06 | 05 | 19 |
| ඔක්තෝබර් | 25 | 12 | 19 | 19 | 19 | 07 | 09 | 03 | 17 |
| නොවැම්බර් | 29 | 08 | 16 | 23 | 23 | 11 | 07 | 07 | 21 |
| දෙසැම්බර් | 27 | 13 | 21 | 28 | 28 | 09 | 06 | 05 | 19 |

| මාසය | පුස්තකාල කමිටුව | සුභසාධන කමිටුව | ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රගති සමාලෝචන කමිටුව | පරිපාලන නිලධාරී රැස්වීම | අධ්‍යයන/ අනධ්‍යයන නිවාස කමිටුව | අධ්‍යයන නිවාඩු කමිටුව | වෘත්තීය සංවර්ධන වැඩමුළුව | විගණන හා කළමනාකරණ කමිටුව | කාර්ය මණ්ඩල රැස්වීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප.ව. 2.00 | ප.ව. 1.00 | පෙ.ව. 9.30 | ප.ව. 1.00 | පෙ.ව. 9.30 | පෙ.ව. 9.00 | පෙ.ව. 9.00 | ප.ව. 2.00 |
| ජනවාරි | 19 | - | 16 | 27 | 21 | 04 | 12 | 18 | 20 |
| පෙබරවාරි | | 02 | 10 | 24 | 21 | 08 | 09 | 15 | - |
| මාර්තු | 16 | 09 | 03 | 31 | 22 | 08 | 09 | 17 | 24 |
| අප්‍රේල් | | - | 07 | 28 | 25 | 05 | 06 | 07 | - |
| මැයි | 11 | 04 | 05 | 26 | 20 | 03 | 11 | 21 | 23 |
| ජුනි | | 01 | 09 | 30 | 21 | 07 | 08 | 14 | - |
| ජූලි | 13 | 06 | 05 | 28 | 21 | 05 | 13 | 13 | 22 |
| අගෝස්තු | | 03 | 04 | 25 | 22 | 02 | 10 | 18 | - |
| සැප්තැම්බර් | 14 | 07 | 04 | 29 | 20 | 06 | 07 | 15 | 26 |
| ඔක්තෝබර් | | 05 | 06 | 27 | 20 | 04 | 12 | 20 | - |
| නොවැම්බර් | 16 | 02 | 04 | 24 | 21 | 08 | 02 | 17 | 28 |
| දෙසැම්බර් | | 07 | 08 | 29 | 20 | 06 | 07 | 15 | - |

ලේඛකාධිකාරී.

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සංවිධාන ධුරාවලිය

